# බස්නාහිර පළාතේ පළාත් සභාව
# Îëù° ëèæèú ëèæèú òéç
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 සැප්තැම්බර් 25 වන අඟහරුවාදා**

2012 îòç°îìë°ç˜ 25 îòô°ôèÁ°æ°æðïéë

Tuesday 25th September 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

çê°êõËù°ù, ² ÛÁô˜ê°êäÇõ, îìä°òðù° îæèç°ÎçæÌô ëèôê°éê, ¡ù.204 ¡ù° Îëù° ëèæèú òéçÁðä° ÇêðÁ æì°ìê° îêèÆêðÁðù° íéëå°Êó°ó ÇêðÁ òéç ëÈìçê°êðù° åéìîç÷°÷ …ì°ìë°.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.44 පළාත් සභාව රැස් විය.**

*Ë.ç.09.44 æ°Æ òéç …âÁÊ*

*The Provincial Council met at 09.44 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**

*êðÕ. êôðòèó˜[Òäðù° ôðÎÛõê°ä íô˜æó°] êéùéë ôæðê°êè˜.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**පූර්ණා - 01**

**ගරු සභාපතිතුමා**

අද දින පැවැත්වෙන මෙම අතිරේක පළාත් සභා රැස්වීම කැඳවීමේ නිවේදනය ඇතුළත් ගරු ආණ්ඩුකාරතුමාගේ, 2012 සැප්තැම්බර් මස 20 වන දාතමින් යුතු "ප්‍රකාශනය" දැන් සභවේ ලේකම්තුමා විසින් කියවනවා ඇති.

# ගරු ආණ්ඩුකාරවරයාගෙන් ලැබෙන සංදේශ
MEMORANDUMS RECEIVED BY THE HON. GOVERNOR

**හේමන්ත සමරකෝන් - සභා ලේකම්වරයා**

ගරු ආණ්ඩුකාරතුමා රැස්වීම කැඳවමින් කරන ලද පහත සඳහන් නිවේදනය මම ප්‍රකාශ කරනවා.

*"සියළු දෙනා විසින් මෙයින් දැන ගත යුතුයි.*

*බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර, සෙයිද් අලවි මව්ලානා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ආ" වගන්තියේ 8 (අ) ඡේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාතේ පළාත් සභාව, වර්ෂ 2012 ක්වූ සැප්තැම්බර් මස 25 වන දින පෙ.ව. 09.30 ට බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 දරණ ස්ථානයේ පිහිටි පළාත් සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම සඳහා මෙයින් කැඳවමි."*

(අත්සන)

සෙයිද් අලවි මව්ලානා,

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර.

2012 සැප්තැම්බර් මස 20 වැනි දින,

කොළඹ 04,

යුනිටි ප්ලාසා,

4 වන මහලේ පිහිටි

බස්නාහිර පළාතේ ආණ්ඩුකාර

ලේකම් කාර්යාලයේ දී ය.

**සභාපතිවරයාගේ නිවේදන**

**ගරු සභාපතිතුමා**

*i*

*"අතිගරු ජනාධිපතිතුමා විසින් අංක සී.එස්.ඒ. 3/4/6 හා 2012 සැප්තැම්බර් 19 දාතමින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික*

*සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත යොමු කරමින්, එම පනත් කෙටුම්පත පිළිබඳව 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) ව්‍යවස්ථාවේ (3) ඡේදය පරිදි පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයක් ලබා දෙන මෙන් දන්වා ඇති බව දැනුම් දෙනවා.*

*ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 1/1/ප්‍රඥප්ති/පොදු හා 2012.09.19 දාතමින් බස්නාහිර පළාතේ පළාත් සභාවේ, සභාපතිවරයා වන මා වෙත එවන ලද ලිපිය මගින් එම දිවි නැගුම පනත් කෙටුම්පත පළාත් සභාව වෙත ඉදිරිපත් කර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) ව්‍යවස්ථාවේ (3) ඡේදය පරිදි පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා 2012.09.28 දිනට ප්‍රථම ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දෙන ලෙස දැනුම් දී ඇති බවත් කාරුණිකව දන්වා සිටිනවා."*

*ii*

*"දිවි නැගුම පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කිරීමට හැකිවන පරිදි, අද දින මෙම අතිරේක සභා රැස්වීම ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රකාශනය මගින් කළ නිවේදනයට අනුකූලව රැස්වී ඇති බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*2012.09.19 දින රැස්වූ සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය වූ පරිදි අද දින පොදු කටයුතු විෂයය යටතේ දිවි නැගුම පනත් කෙටුම්පත පිළිබඳව පමණක් සාකච්ඡා කිරීමට අදහස් කරන බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*සභා කටයුතු පිළිබඳ කාරක සකභාවේදී තීරණය වූ පරිදි, මෙම සභාවේ අදහස් දන්වා යැවීමට ඇති සීමිත කාල පරාසය සළකා බලා, ඉහත සඳහන් පනත් කෙටුම්පත් හා අදාළ ලිපිලේඛන සහිත අද දිනට නියමිත න්‍යාය පත්‍රය සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත පෞද්ගලිකවම ලැබෙන්නට සලස්වා ඇති බවත් දැනුම් දෙනවා.*

*එමෙන්ම අද දිනට නියමිත එම විශේෂ කටයුත්ත නිම කිරීමට හැකිවන පරිදි සභාවේ අනෙකුත් කාර්යයන් සඳහා කාලය සීමා කිරීමේදී ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවත් පූර්ව දැනුම් දීමක් කරනවා."*

**ලිපි ලේඛන පිළිගැන්වීම**

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවා මෙම පළාත් සභාවට යොමු කර ඇති, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත" නැමැති ලේඛනය මම මෙම සභාවට පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**

මීට පෙරත් දැනුම් දුන් පරිදි එම පනත් කෙටුම්පතේ පිටපත් දැනටමත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ලැබෙන්නට සලස්වා තිබෙනවා. ඒ පිළිබඳව සාකච්ඡා කිරීම පොදු

කටයුතු විෂයයට එළැඹුණු විට කළ හැකි බවත් මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට කාරුණිකව දැනුම් දෙනවා.

**කාරක සභා වාර්තා**

**ගරු සභාපතිතුමා**

2012.09.19 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

*අදාළ වාර්තාවේ පිටපත් ............*

**පෙත්සම්**

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. අළුබෝමුල්ල, පමුණුගම, හොරණ පාර, අංක 274/4 හි පදිංචි ඒ. නාලක පෙරේරා යන අයගේ පෙත්සම,

ii. පානදුර, වැකඩ, හොරණ පාර, අංක 195 හි පදිංචි ජී. අජිත් ඩී. සිල්වා යන අයගේ පෙත්සම සහ

iii. බේරුවල, මහගොඩ, බප/කළු අයි.එල්.එම්. සම්සුදීන් විදුහල, නියෝජ්‍ය විදුහල්පති, ඒ.ඒ. අබ්දුල් රහුමාන් යන අයගේ පෙත්සම.

**ගරු ලලිත් එල්ලාවල**

ගරු සභාපතිතුමනි, බණ්ඩාරගම, රයිගම, කොස්වත්ත, අංක 188/5/ඒ හි පදිංචි ගාමිණී ශාන්ත කුමාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් ....................***

**ගරු සභාපතිතුමා**

කාලය ඉතිර කර ගැනීමට අවශ්‍ය බැවින් අද දිනට පෞද්ගලික පැහැදිලි කිරීම් අත්හිටුවීමට අප තීරණයක් අරගෙන තිබෙනවා. ඒ නිසා අද පෞද්ගලික පැහැදිලි කිරීම් කිසිවක් නැහැ.

**පළාත් සභාවේ කටයුතු**

**ගරු ජගත් අංගගේ අමාත්‍යතුමා**

ගරු සභාපතිතුමනි, *''බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත පළත් සභාව වෙත ඉදිරිපත් කර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) ව්‍යවස්ථාවේ (3) ඡේදය පරිදි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීමට හැකිවනු පිණිස 2012.09.28 දිනට ප්‍රථම ලබා දෙන ලෙස, 2012.09.19 දිනැතිව දන්වා ඇති හෙයින් ද, ඒ පිළිබඳව 2012.09.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී කළ පූර්ව සාක- ඡාවට අනුගතවද අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ සඳහන් එකී පනත්*

*කෙටුම්පත සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 15(1), 15(4), 57(1), 57(3), 57(4), 57(5), 63 අ(2), 63 අ(3), 88(2) හා 88(3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## දිවිනැගුම පනත් කෙටුම්පත : පාර්ලිමේන්තුව පළාත් සභාවේ අදහස් විමසීම

.................................

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (උ) ව්‍යවස්ථාවේ (3) වන ඡේදය පරිදි බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා 2012.09.28 දිනට ප්‍රථම බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දෙන ලෙස දන්වා ඇති හෙයින්, ඊට අවකාශ සැලසෙන පරිදි එම පනත් කෙටුම්පත පිළිබඳව මෙම පළාත් සභාව විසින් සාක- ඡා කර එළඹෙන තීරණයන්ට අනුකූලව එම අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු රේණුක පෙරේරා**

***විසින් ස්ථිර කරන ලදී.***

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - දිවි නැගුම පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීමේ අවස්ථාවට අප දැන් එළැඹෙන තිබෙනවා. මම මුලින්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ආරාධනා කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්න. පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තයෙන් මේ දිවි නැගුම පනත් කෙටුම්පත අයින් කරලා තියෙනවා. (පටිය) (බාධා කිරීම්) මම අහන්නේ සභාපතිතුමාගෙන්. ඔබතුමන්ලා පොඩ්ඩක් කැගහන්නේ නැතුව ඉන්න.

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා නිශ්ශබ්ද වෙලා එතුමාට අවස්ථාව දෙන්න.

[සභාවේ ඝෝෂා] (පටිය)

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ඔබතුමාට ඕනෑ නැති වුණාට මේක මට ඕනෑ. ඔබතුමාට ඕනෑ ඕනෑ විධියට අහන්න -

**ගරු සභාපතිතුමා**

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ඔබතුමා කෑගහන්නේ නැතුව වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ මේ සම්බන්ධව තිබෙන නීති රාමුව පිළිබඳවයි. මෙහෙම අපට සාක- ඡා කිරීමට හැකියාවක් තිබෙනවාද කියලා. මොකද, පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයෙන් ඉල්ලා අස්කර ගත්තාට පස්සේ -

**ගරු නිමල් ලාන්සා**

ඔ- වර මෝඩද?

**ගරු රේණුක පෙරේරා**

තාත්තාගෙන් ගෙදරදි අහගන්න තිබුණා නේ?

**ගරු සභාපතිතුමා**

මේ පනත් කෙටුම්පත -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

අර මෝඩයෝ ටිකටත් අහගන්න කිව්වා නම් හොඳයි.

**ගරු සභාපතිතුමා**

මේ පිළිබඳව ගරු අධිකරණය තීන්දුවක් ලබා දීලා තිබෙනවා පළාත් සභාවේ කැමැත්ත ගන්න කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, කැමැත්ත ගන්න කියලා තියෙන්නේ මේක පළාත් සභාවට -

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා මම කියනකම් ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

දැන් මේක දැම්මාට පස්සේ, ඉල්ලා අස් කරගෙන -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

ගරු අධිකරණය පැහැදිලිව තීන්දුවක් අරගෙන තිබෙනවා, මෙම කෙටුම්පත සම්බන්ධව අදාළ පළාත් සභාවල කැමැත්ත අරගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. ගරු සභානායකතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. නමුත් එතුමා ඒක තාවකාලිකව ඉල්ලා අස් කර ගත්තා පළාත් සභාවල කැමැත්ත ලබා ගත්තාට පස්සේ නැවත වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට. ඒක තමයි නීතිමය තත්ත්වය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ඔබතුමා -

**ගරු ඉසුර දේවප්‍රිය**

අපි කනගාටු වෙනවා -

**ගරු සභාපතිතුමා**

ඔබතුමන්ලාට දිගින් දිගටම විවාදයට යන්න දෙන්න බැහැ. ඔබතුමාට මම පැහැදිලි කිරීමක් කළා. ඔබතුමාට ඒකට අභියෝග කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

මට ඒ ප්‍රශ්නය පොඩ්ඩක් පැහැදිලි මදී.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, තාවකාලිකව ඉල්ලා අස් කර ගත්තා කියන එකට කථානායකතුමාගෙන් යම්කිසි ලියවිල්ලක් තියෙනවාද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

පාර්ලිමේන්තුවෙන් ප්‍රකාශ කළේ. ගරු මන්ත්‍රීතුමා අපට ඒ ගැන කථා කරන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, මේක -

**ගරු සභාපතිතුමා**

අපට ඒ ගැන කථා කරන්න බැහැ. ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ අදහස් විමසන එක වෙනම ප්‍රශ්නයක්. නමුත් මේකට අධිකරණයේ

තීන්දුවක් දුන්නේ, පළාත් සභාවට යොමු කරන්නේ නැතුව පාර්ලිමේන්තුවට ගෙනැල්ලා පාස් කර ගන්න හදපු නිසා.

**ගරු සභාපතිතුමා**

නැහැ, නැහැ. ඔබතුමා වැරැදි අර්ථ කථන දක්වන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ඒ නිසා තමයි.

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමා පැහැදිලි කිරීමක් කළා නේ? දැන් කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

මට ඔබතුමාගේ උත්තරේ පැහැදිලි මදී.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්න මතු කරන්න එපා. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

මේක අනවශ්‍ය දෙයක් නොවෙයි. මේක අවශ්‍ය දෙයක්.

**ගරු සභාපතිතුමා**

මේ පිළිබඳව පැහැදිලි කළා. විවාදයකට යන්න දෙන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

සියලුම දෙනා වාඩි වෙන්න. මගේ තීන්දුව ප්‍රකාශ කළා.

**ගරු රේණුක පෙරේරා**

ගරු සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රීතුමා මේ ආකාරයෙන් දිගින් දිගටම මේ සභාවේ හානිකර ලෙස හැසිරෙනවා. ඒ සම්බන්ධව තීන්දුවක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, මේක රීති ප්‍රශ්නයක්. එතුමාට ඕනෑ ඕනෑ විදියට මේ සභාව මෙහෙයවන්න බැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය**

මොකක්ද රීතිය කියන්න?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ඔබතුමා ඉඳ ගන්න. ඔබතුමා මොන රීතියක්වත් දන්නේ නැහැ නේ? ඔබතුමා මොනවාද දන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.***

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වාඩි වෙන්න. 69 වැනි රීතියේ පැහැදිලිව කියලා තිබෙනවා.

**ගරු සිරිකමල් ද සිල්වා**

ගරු සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මෝඩයා කියලා ප්‍රකාශයක් කළා. මෝඩයා වාඩි වෙන්න කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

මට මේ ඝෝෂාව නිසා ඇහුවේ නැහැ. එහෙම දෙයක් තිබෙනවා නම් මම ඉවත් කරන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, අපට රීති ප්‍රශ්නයක් අහන්න මෙතුමන්ලා අවස්ථාව දෙන්නේ නැත්නම් -

**ගරු සභාපතිතුමා**

නැහැ, ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා. ඊට මම පැහැදිලි උත්තරයක් දුන්නා ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ඒක පැහැදිලි මදී.

**ගරු සභාපතිතුමා**

සභාපතිතුමාගේ තීරණයට ඔබතුමා අවනත වෙන්න. දිගන් දිගටම විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල**

අපි හිතමු යම් මන්ත්‍රීවරයෙකුගේ නොදැනුවත්කමට යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇහුවාම ඒක නිවැරැදි කිරීම ඔබතුමාගේ යුතුකමක්. නමුත් මේ විධියට වචන පාවි- චි කරන එක වැරැදි දෙයක්. පිළිතුරු දීම ඔබතුමාගේ වගකීමක් ඇරෙන්න -

**ගරු සභාපතිතුමා**

මම පිළිතුරු දුන්නා ගරු විපක්ෂ නායකතුමා. මම පිළිතුරක් දීලා ඉවරයි. කරුණාකරලා ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

නීතියක් නැති රටක් නිසයි අපි වාඩි වෙන්නේ.

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා දිවි නැගුම පනත් කෙටුම්පත සම්බන්ධව අදහස් දැක්වීමට.

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, මේ පනත පිළිබඳව අද මාධ්‍ය හරහා ලොකු කථා බහකට ලක් වෙලා තිබෙනවා. මේ පනත පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළාම මෙය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව උසාවියට යම් පාර්ශවයක් විසින් ගෙන ගියා. අද උසාවියේ නියෝගයක් ලැබිලා තිබෙනවා. අද රාජ්‍ය නායකයා උසාවිවලට ගල් ගහන්නේ නැති නායකයෙක් නිසා මේ පනත -

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් ද සිල්වා**

කථාව කරගෙන යන්න. අනාගන්න එපා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා එතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල**

ඉස්සර ඇමැතිවරු ගල් ගැහුවේ නැහැ. දැන් ගල් ගහන්නේ ඇමැතිවරු.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

ගරු ඇමැතිතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු සිරිකමල් ද සිල්වා**

බර්ටිට දුන්නේ නැති වුණාම හය වුණා.

**ගරු නිරෝෂන් පාදුක්ක**

බර්ටිට වුණු දේ වෙන්නේ නැහැ. හය වෙන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, රාජ්‍ය නායකයා -

**ගරු ජෝර්ජ් පෙරේරා**

බර්ටිගේ ප්‍රශ්නේ -

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, මම මෙතුමා ගැන කථා කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා මයික්‍රෆෝන් ඕෆ් කරන්න. මයික්‍රෆෝන් පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග**

උසාවියට ගරු කරලා මේ පනත පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තයෙක් ඉවත් කරලා විධිමත් ලෙස

අධිකරණයට ගරු කරපු නායකයෙක් හැටියට, විශේෂයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා මේ පනත අද පළාත් සභාවට යොමු කරලා තිබෙනවා. මම හිතන්නේ, පළාත් සභාවට යොමු කරපු පනත පළමුවෙන්ම විවාදයට, සාක- ඡාවට භාජනය වෙන්නේ, බස්නාහිර පළාතේ. ගරු සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකාවේ දක්ෂිණ සංවර්ධන අධිකාරිය, ඒ වාගේම ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය මේ ආයතන තුන එකතු කරලා දෙපාර්තමේන්තුවක් බවට පත් කරලා තිබෙනවා. මම හිතන්නේ, මේක මහින්ද චින්තන ඉදිරි දැක්මේ රාජ්‍ය සේවාව ශක්තිමත් කරන වැඩ පිළිවෙළවලට සමගාමීව මේ වැඩ පිළිවෙළ ඉතාමත්ම වැදගත් දෙයක් බවට පත් වෙලා තිබෙනවා. මට මතකයි එදා අපි සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කළාට පස්සේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පත්වීම් පිළිබඳව ව්‍යාකූල තත්ත්වයක් ඇති වුණු වෙලාවේදී, සමෘද්ධි ව්‍යාපාරය වෙනුවෙන් අපි පෙනී සිටියා. එදා අපේ ආණ්ඩු පක්ෂයේ අය හැටියට පළාත් සභාව නියෝජනය කරමින් එවකට හිටපු ජනාධිපතිතුමියට කරුණු ඉදිරිපත් කරලා සමෘද්ධි සුරැකීමේ ව්‍යාපාරය අපි ආරම්භ කරලා එය සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරීමේ වැඩ පිළිවෙළටත් එදා මම සම්බන්ධ වුණා. ඒ නිසා මම විශ්වාස කරනවා එදා සිට ඒ අය වෙනුවෙන් පෙනී සිටි කෙනෙක් හැටියට මේ පනත තුළින් අද විශාල සහනයක් මේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ලැබිලා තිබෙනවා. අපට ඒක පැහැදිලිව පෙනෙන්නේ සමෘද්ධි සංවර්ධන –

**ගරු දයාකාන්ත පෙරේරා**

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා අතේ ලැප්ටොප් පරිගණකයක් තිබෙනවා. පරිගණකයක් පාවි- ච් කරනවා.

**ගරු සභාපතිතුමා**

ඒක අපි ලිඛිතව දුන් නැතත් අපි අවසරය ලබා දීලා තිබෙනවා.

**ගරු සිරිකමල් ද සිල්වා**

ඒක දන්නෙත් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා අපි ගියවර අයවැය විවාදයේදී අපි ලබා දීලා තිබෙනවා. කැමැති නම් ගෙන එන්න පුළුවන්.

**ගරු සිරිකමල් ද සිල්වා**

ඔය ප්‍රධාන ඇමැතිතුමාගේ කථාවට බාධා කරන්න තියෙන උවමනාව.

**ගරු සභාපතිතුමා**

එතුමාට බාධා කිරීම් කරන්න එපා. කෙටි කාලයක් තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, ඒ නිසා මම ඉහත සඳහන් කරපු ආයතන තුන තුලනය කරලා අද මේ දෙපාර්තමේන්තුව පිහිටුවීම හරහා විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේ ජීවත් වන සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල්වලට පවා මේකේ ප්‍රතිලාභ -

**ගරු සුනිල් ජයමිණි**

ගරු සභාපතිතුමනි, ඔබතුමා සඳහන් කළා අනුමැතියක් ලබා දුන්නා කියලා. මම දැන කැමැතියි කොහොමද අනුමැතිය ලබා දුන්නේ කියලා.

**ගරු රේණුක පෙරේරා**

ගරු සභාපතිතුමනි, අපි වගකීමක් ඇතුව මේ සභාවට කියනවා මේ සභාවේ එහෙම අනුමැතියක් දීලා නැහැ. කොයි සභාවේද, කොයි කාරක සභාවේද එහෙම අනුමැතියක් දුන්නේ කියලා අපි ප්‍රශ්න කරනවා.

**ගරු සභාපතිතුමා**

මීට පෙරත් -

**ගරු රේණුක පෙරේරා**

මේවා සාකච්ඡා වුණා. අනුමැතියක් දුන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

මේවා කථා කරලා සභාවේ පිට කරන්න.

**ගරු සභාපතිතුමා**

එක්කෙනෙක් කථා කරන්න කෝ? දයාකාන්ත පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු රීති ප්‍රශ්නය පිළිබඳව, අපි ගියවර අයවැය විවාදයෙන් පස්සේ අපි අවසරය ලබා දුන්නේ - නමුත් අපේ යම් යම් ඇමැතිතුමන්ලා, ගරු ප්‍රධාන ඇමැතිතුමා, අනෙකුත් ඇමැතිතුමන්ලාත්, Eye Pad වාගේ ලැප්ටොප් සභාවට අරගෙන ආවා. අපි ඒකට විරුද්ධතාවයක් ප්‍රකාශ කළේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීතුමා මීට පෙරත් අරගෙන ආවා. අපි ඒකට විරුද්ධත්වයක් ප්‍රකාශ කළේ නැහැ. පාර්ලිමේන්තුවේත් ඒ දේ කෙරෙන නිසා.

**ගරු කිත්සිරි මංචනායක**

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු රේණුක පෙරේරා**

ගරු සභාපතිතුමනි, සභා රීති සකස් වුණාට පස්සේ එක අවස්ථාවක -

**ගරු කිත්සිරි මංචනායක**

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**

මේ වැදගත් විවාදය අවස්ථාවේදී අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්න එපා. මීට පෙරත් මේ සභාවේ ලැප්ටොප්

පරිගණක පාවි- චි කළා. සභා නායකතුමා මේක අමුතු දෙයක් නොවෙයි.

**ගරු කිත්සිරි මංචනායක**

ගරු සභාපතිතුමනි, -

**ගරු රේණුක පෙරේරා**

එහෙම නම් ඉදිරියට ජංගම දුරකථන (බාධා කිරීම්) දෙන්න ඔබතුමා. ඔබතුමා එහෙම දෙන්න. ඔබතුමාට එහෙම හිතුවක්කාර තීන්දුවක් ගන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

මම කිසිම හිතුවක්කාර තීන්දුවක් ගත්තේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, දිවි නැගුමට විරුද්ධ අය මේ ඉන්නේ.

**ගරු රේණුක පෙරේරා**

අයවැයෙන් පස්සේ කොහොමද අනුමැතියක් දුන්නේ?

[සභාවේ ඝෝෂා]

අයවැයෙන් පස්සේ කොහොමවත් අවසරයක් දුන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**

අයවැයෙන් පස්සේ -

**ගරු රේණුක පෙරේරා**

අපි සභාවට සහභාගී වුණා.

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, මොන වරප්‍රසාදය යටතේද මෙතුමා කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**

මේ කෙටුම්පත විවාදයකට ගන්න අවස්ථාවේ අපි තීන්දුවක් ගත්තා න්‍යාය පත්‍රයෙන් අනවශ්‍ය දේවල් ඔක්කෝම අයින් කරනවා කියලා. නමුත් ගරු සභානායකතුමා, ආණ්ඩු පක්ෂ ගරු ප්‍රධාන සංවිධායකතුමා (බාධා කිරීම්) කරුණාකරලා ඔබතුමා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා මීට පෙර දැක්කේ නැද්ද අපේ අල්ලපු ආසනයේ ඉන්න උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා Eye Pad ලැප්ටොප් එකක් ගේනවා. ඇයි ඔබතුමා මේ අවස්ථාවේ -

[සභාවේ ඝෝෂා]

අනවශ්‍ය රීති ප්‍රශ්න කථා කරන්න එපා. මෙතුමාගේ පෞද්ගලික -

[සභාවේ ඝෝෂා]

**ගරු කිත්සිරි මංචානායක**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**

අනවශ්‍ය ප්‍රශ්නයක් මේ.

**ගරු කිත්සිරි මංචනායක**

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**

කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා මීට පෙරත් ගේනවා මම දැකලා තිබෙනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් ගේනවා.

**ගරු කිත්සිරි මංචනායක**

ගරු සභාපතිතුමනි, විනාඩියක් දෙන්න. ගියවර අයවැය විවාදය වෙලාවේදී මේ කාරක සභාවේ හැන්සාඩ් සංස්කාරකතුමා පාවි- චි කළා. ඇමැතිවරු පාවි- චි කළා. මේ සභාවට ගෙනැල්ලා දත්තයන් ගත්තා. එදා ඒකට ඉඩ දීලා තිබුණා. මම දන්නවා මෙතුමා ගෘහ කාරක සභාවේදීත් මේකට පෞද්ගලිකව විරුද්ධ වෙනවා. මම හිතන්නේ මෙතුමා මේ ගැන දන්නේ නැති නිසා වෙන්න ඇති. නමුත් ගරු සභාපතිතුමනි, මේක විපක්‍ෂයට විතරක් සීමා කරන්න එපා. විපක්‍ෂයට විතරක් තහංචි දාන්න එපා. ආණ්ඩු පක්‍ෂයේ මන්ත්‍රීවරු, ඇමැතිවරු සභා ගර්භයට ගෙන එනවා. නිලධාරිනුත් ගේනවා. අද නිලධාරීන්ටත් වඩා විපක්‍ෂයේ මන්ත්‍රීවරුන්ව සැහැල්ලු කරලා තිබෙනවා. නිලධාරීන්ටත් ගේන්න ඉඩ දෙනවා. ඇමැතිවරුන්ටත් ගේන්න ඉඩ දෙනවා.

**ගරු සුනිල් ජයමිණි**

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ කථාව අපි හොඳින් අහගෙන හිටියා. තමුන්නාන්සේ දැන් කිව්වා විද්‍යුත් උපකරණ ගේන්න යම් යම් අවස්ථාවලදී අවසර දීලා තිබුණා කියලා.

**ගරු සභාපතිතුතමා**

යම් යම් අවස්ථාවල නොවෙයි. අපි -

**ගරු සුනිල් ජයමිණි**

අද වැදගත් පනතක් සාක- ඡා වන නිසා අපි නිහඬව ඉන්නවා. මට තමුන්නාන්සේ සභා කටයුතු කාරක සභාවේදී පෙන්නුම් කරන්න ආණ්ඩු පක්‍ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් දිගින් දිගටම විරුද්ධත්වය පළ කළා. මේ සභාවේ විපක්‍ෂයේ අනෙක් සියලුම මන්ත්‍රීවරුන්ට

සභාට විද්‍යුත් උපකරණ ගෙන ඒමට අවස්ථාව ලබා දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**

ගැළුවක් නැහැ. කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුනිල් ජයමිණි**

ඒ නිසා මේ සම්බන්ධව අවසර දීපු ලිඛිත ලිපියක් -

**ගරු රේණුක පෙරේරා**

රීති උල්ලංඝණය කිරීමක්. ඒත් මේ පනත සම්බන්ධයෙන් තිබෙන වැදගත්කම නිසා අපි නිහඬ වෙනවා. හැබැයි ඔබතුමා රීති කාරක සභාවේදී මේ සම්බන්ධව සාකච්ඡා කළ යුතුයි. මේ රීති පොතේ පැහැදිලිව කියලා තිබෙනවා (බාධා කිරීමක්) පුවත්පත්, ප්‍රකාශ සභාවට ගෙන ඒම තහනම් කියලා රීතිවල පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා.

**බී පැත්ත (සම්බන්ධය නිවැරැදියි)**

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, මොන වරප්‍රසාද යටතේද මෙතුමා කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**

එක පැත්තකින් මම කනගාටු වෙනවා. මීට පෙර මේ සම්බන්ධව නොදැකීම පිළිබඳව.

[සභාවේ ඝෝෂා]

ඕනෑම දිනක ගෙන එන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ලැජ්ජයි. ආණ්ඩු පක්ෂයේ සංවිධායක.

**ගරු සභාපතිතුමා**

මේ පිළිබඳව අපි දිගින් දිගටම විවාදයකට යන්න අවශ්‍ය නැහැ සංවිධායකතුමා.

**ගරු සිරිකමල් ද සිල්වා**

පැහැදිලිව ගරු ප්‍රධාන ඇමැතිතුමාට තියෙන විරෝධය තමයි මේ පෙන්නුවේ.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා කථා කරන්න ගරු ඇමැතිතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**

කෙටියෙන් කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හිතෙන හිතෙන වෙලාවට නැගිටලා කථා කරන්නේ මොන වරප්‍රසාදයක් යටතේද? අපටත් අවසර දෙන්න ඕනෑ එහෙම කථා කරන්න. ඒ වරප්‍රසාදය අපටත් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා.**

එහෙම රීතියක් නැහැ. කථා කරන මන්ත්‍රීවරුන්ව වළක්වන්න මට බැහැ. කෑගහන මන්ත්‍රීවරුන්ව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

එතුමා මයික්‍රෆෝනය ඔන් කරලා හැම තිස්සේම කථා කරන්නේ. එහෙම නම් අපටත් ඒ වරප්‍රසාදය දෙන්න ඕනෑ. එතුමාට විතරක් එහෙම දෙන්න බැහැ නේ? ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ කථාවට එතුමා බාධා කළේ. ප්‍රධාන ඇමැතිතුමා කථා කරන්න බලාගෙන ඉන්නවා. මෙතුමා කථා කරන්න දෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**

ගරු සභාපතිතුමනි, මේක විශේෂ සභා වාරයක්.

**ගරු සභාපතිතුමා**

ඒක තේරුම් ගන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර**

මේ පනත සම්බන්ධයෙන්. එක එක්කෙනාට ඕනෑ විදියට මේ සභාව ගෙනියන්න බැහැ. ඔබතුමාට මේ සභාවේ රීති මාලාවක් දීලා තියෙනවා. ඒ අනුව කටයුතු කරන්න.

**ගරු සභාපතිතුමා**

හරි පැහැදිලියි. අද විශේෂ සභා රැස්වීමක් තියෙන්නේ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඝෝෂා කිරීම් පුළුවන් තරම් දුරට අවම කරලා අපි කථික මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබලා දෙමු කථා කරන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමා කථා කළේ. එතුමාට අවස්ථාව ලබලා දුන්නෙත් නැහැ නේ? ගරු ප්‍රධාන ඇමැතිතුමා, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට තව විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග**

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අපි විශ්වාස කරනවා, අපි මධ්‍යම රජයත්, පළාත් සභාවත් විශේෂයෙන්ම මහින්ද චින්තන වැඩ පිළිවෙළට සමාගමීව යන වැඩ පිළිවෙළක් නිසා මේ පනත සම්මත කිරීමේ වැදගත්කම අපි දකිනවා. මේ පනත ක්‍රියාත්මක වනකොට මම හිතන්නේ, අනෙක් පනත්වලට වඩා - මේකෙදී මම නම් මොනම ආකාරයෙන්වත් දකින්නේ නැහැ පළාත් සභාවල බලතල මේකෙන් අඩුවීමක් සිද්ධ වෙනවා කියලා. මේ පනත හරහා අපි දකිනවා, මධ්‍යම

රජයෙන් ක්‍රියාත්මක වන ජාතික වැඩ පිළිවෙළ ගමට ගෙයන්න පුළුවන් වැඩ සටහනක් හැටියට. ඉතාමත්ම වැදගත් ග්‍රාමීය මට්ටමේ ජනතාවට තීන්දු තීරණ අරගෙන තමන්ට කටයුතු කිරීමේ හැකියාව මේ පනත හරහා තිබෙනවා. අපි ඉන්දියාවේ ගිය වැඩ සටහන්වලදී දැකපු දෙයක් තමයි පඤ්චාත් ක්‍රමවේදය, ගම්සභා වැඩ පිළිවෙළ ඒ රටේ සංවර්ධනයට වැදගත් තීන්දු අරගෙන තිබෙනවා. ඒ හා සමාන වැඩ පිළිවෙළක් හැටියට තමයි මේ දිවි නැගුම පනත මම දකින්නේ. ඒ නිසා පළාත් සභාවක් හැටියට විශේෂයෙන්ම මේ පනත සම්මත කර ගන්න තමුන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීම කරන අතර, මේ පනත හරහා ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ ජනතාව පැත්තෙන් ඉතා සුභවාදීව බලලා මේකට කටයුතු කරයි කියන විශ්වාසය ඇතුව මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලා සිටිනවා. මේ විවාදය, මේ සාක- ඡාව ඉතාමත් ගෞරවාන්විතව සාක- ඡා කළ යුතු ඉතා වැදගත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි හැම කෙනෙක්ම සභා රීතිත් ආරක්ෂා වන විධියට කථා කළොත් හොඳ වටිනාකමක් තිබෙනවා. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා සාකච්ඡාවට සම්බන්ධ වන ලෙස. ඔබතුමාට විනාඩි 06 ක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, අද පළමුවැනි කාරණය තමයි අපි දන්නවා බර්ටි ප්‍රේමලාල් දිසානායක ඇමැතිවරයා - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**

එතුමා කථාව පටන් ගත්තා විතරයි. මම මුලින් කිව්වෙත් ඒක නේ? එතුමා අවස්ථාව දෙන්න. එතුමා බර්ටි ප්‍රේමලාල් ඇමැතිතුමාගේ නම කිව්වාට බය වෙන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**

එතුමා ගැන හොඳ නොවෙයි කියන්නේ.

**ගරු සභාපතිතුමා**

එතුමා කියන්න ආරම්භ කළා විතර නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, එතුමා මහමාත්‍යවරයා විධියට හිටපු කාලේ මේ වාගේ පනතක් උතුරු මැද පළාත් සභාවේ පරාජයට පත් කළා. එතුමාට ඒ සඳහා කශේරුව තිබ්බා. නමුත් අද මහ ඇමැතිවරු මේ යෝජනාවට - (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට කථා කරන්න මට ඉඩ දෙන්න. ඉතාහාසයේ අපි දැක්කා 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් දීපු බලතල එකින් එක මේ රටේ පවරා ගන්නවා. අපි ආදයම් තත්ත්වයන් පවරා ගනු ලැබුවා. ඉඩම් බලතල ගත්තා. ගොවිජන සේවා පනත අපෙන්

හකුලා ගත්තා. මේ සියල්ලම මධ්‍යම ආණ්ඩුව ගත්තා. හැබැයි බලය තවදුරටත් විමධ්‍යගත නොකළ යුතු යුගයක මේ සියල්ල පවරා ගද්දී බර්ට් ප්‍රේමලාල් මැතිතුමාට අද මහ ඇමැතිකම අහිමි වුණා.

[සභාවේ ඝෝෂා]

අහගන්න කෝ? අයියෝ. චොරයෙක් ඔයා. ගරු සභාපතිතුමනි, අපි දන්නවා මේ පනත පාර්ලිමේන්තුවට ගෙනාවා. පාර්ලිමේන්තුවේ ආණ්ඩුවට 2/3 තියෙනවා. ඇයි ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වේ මේවා පළාත් සභාවලින් අහන්න කියලා? පළාත් සභාව සතු බලතල මධ්‍යම ආණ්ඩුව භාර ගන්න හදන නිසා. ගරු සභාපතිතුමනි, මෙහෙම කියලා තියෙන්නේ. නැත්නම් පාර්ලිමේන්තුවේ 2/3 ත් අනුමත කර ගන්න තිබුණා. මොකක්ද ගරු සභාපතිතුමනි මේ පනතේ කියන්නේ? මේකෙන් බැංකුවක් හැදෙනවා. අද අපි දන්නවා - බැංකුවක කෙරෙන්න ඕනෑ සියලුම කාරණා මේ බැංකුව හරහා සිදු වෙනවා. එදා සමෘද්ධියට බැංකු වචනය පාවිච්චි කරන්න ඒ.එස්. ජයවර්ධන මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉඩ දුන්නේ නැහැ. බැංකු නම වෙනස් කළා. ඊට පස්සේ මොකද වුණේ ගරු සභාපතිතුමනි. සමෘද්ධිය තමන්ගේ සල්ලිවලින් පැන් ඒෂියා බැංකුවේ 13% ක් කොටස් ගත්තා. එදා සමෘද්ධි ආයතනය. මේ මුදල් අනවශ්‍ය විධියට පරිහරණය කළා. පොත් ගහන්න සල්ලි දුන්නා. අද මේ පනතේ අවසානය වනකොට - ගරු සභාපතිතුමනි, අපට කථා කරන්න ඉඩ දෙනවා නම් කියන්න පුළුවන්. අපි මේකට විරුද්ධව නොවෙයි කියන්නේ. මම දන්නවා මෙතැන ඉන්න මන්ත්‍රීවරු ගොඩාක් දැන් හිතාගෙන ඉන්නේ, තමන්ගේ වාරය එනකල් ආණ්ඩුවට භක්ති ගීත කියන්න. ඒක නොවෙයි කාරණය. අපට අවශ්‍ය වෙන්නේ ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ බොහෝ දේවල් - 1988 අංක 30 දරණ බැංකු පනතේ අනුකූලව මේ මුදල් එකතු කරන්න බැංකුවක් විධියට ක්‍රියා කරන්න බැහැ. පසුගිය අවුරුද්දේ මේ ජනාධිපතිවරයා යටතේ පටන් ගත්තු 2011 අංක 42 දරන පනතින් මූල්‍ය ආයතනයක් විධියට ක්‍රියා කරන්න බැහැ. නමුත් මේ දෙක මත ආයතන හරහා සිදු වෙමින් පවතිනවා. සමෘද්ධි අධිකාරිය යටතේ තිබෙන බිලියන 52 ක මුදලක් මේ දිවි නැගුම යටතට එනවා. ඒකේ එක තැනක තිබෙනවා,

මෙම අරමුදලට බැර කරන පවතින මුදල් අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන පරිදි කාර්යයන් සඳහා යම් ආකාරයකින් භාවිතා කරනු ලැබිය හැක.

අවශ්‍ය නම් EPF එකේ දාන්න - මේ සල්ලි ගෙනැල්ලා කොටස් වෙළඳ පොළේ දාන්න පුළුවන්. එහෙම නම් ලෝකයේ බංකොලොත් වුණු රටවල්වලට දාලා, ග්‍රීසියේ දැම්මා වාගේ මේ රටේ අහිංසක මිනිසුන්ගේ මුදල් නාස්ති කරන්න පුළුවන්. මේකෙන් මොකක්ද ගරු සභාපතිතුමනි, වෙන්නේ? මේකේ කිසිම තැනක සඳහන් වෙනවාද අහිංසක සමෘද්ධිලාභීන්ට ලැබෙන මුදල සම්බන්ධයෙන්. මාසෙකට කීයක් දෙන්න හදාගෙන ඉන්නවාද? කීයක් මෙතැන සඳහන් වෙනවාද? ඒවා කිසි දෙයක් මේකේ සඳහන් වෙන්නේ නැහැ ගරු සභාපතිතුමනි. තමුන්නාන්සේගේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන්ම, මේ යෝජනාව හරහා මතු වෙමින් පවතින කාරණා තුළදී කළමනාකරණ (බාධා කිරීමක්) දාලා තියෙනවා. කළමනාකරණ මණ්ඩලයේ ඉන්න පස් දෙනා කවුද? හැබැයි මේකට ඇතුළත් වෙනවා මහ බැංකුවේ අධිපතිවරයා විසින් පත් කරන

එක පුද්ගලයෙක්. එහෙම නම් මේක බැංකු පනතට පටහැනියි. මහ බැංකු අධිපතිවරයාට බැහැ මේකට පුද්ගලයෙක් පත් කරන්න. එහෙම නම් මේක බැංකුවක් බවට පරිවර්තනය වෙනවා. බැංකුවක් විධියට පරිවර්තනය වෙනවා නම් බැංකු පනතට අනුකූලව ක්‍රියා කරන්න ඕනෑ. ණයට මුදල් දෙනවා කියලා තියෙනවා. මුදල් තැන්පතු භාර ගන්නවා කියලා තිබෙනවා. පාස් පොත් නිකුත් කරනවා කියලා තිබෙනවා. ණය දෙන්න වාගේ - මුදල් ප්‍රසාරණය වීමේ සිදු වීම් මාලාවක් මේ හරහා සිදු වෙමින් පවතිනවා ගරු සභාපතිතුමනි. එතකොට බැංකුවක් විධියට (බාධා කිරීමක්) මම දන්නවා ඉදිරියේ ඡන්දයක් තියෙන නිසා නිලධාරීන් ටික මෙතැනට ගෙනැල්ලා කැඟහගත්තා. මම දන්නවා. කමක් නැහැ. ඡන්දයක් ළඟ නිසා තමුන්නාන්සේ ලකුණු ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු ජගත් කුමාර**

අපි අවුරුදු 15 ක් තිස්සේ කථා කළේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, කථා කරන්න බැහැ නේ? කරදර කරනවා.

**ගරු ජගත් කුමාර**

බොරු කියන්න එපා.

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා අපි ඉල්ලා සිටින්නේ -

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**

ඊට අමතරව කියනවා දිවි නැගුම ප්‍රජා මණ්ඩල නියාමකය, බැංකු සමිති අධීක්‍ෂණය හා නියාමනය, මහ බැංකුවේ සුපර්වයිසර් කාර්ය භාරයත් කරන්න භාර අරගෙන තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා මතක තියා ගන්න. මේ මොකක්ද වෙන්නේ? දුප්පත් ජනතාවට, මට කථා කරන්න තව අවස්ථාව - ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට තව විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා. ජෝර්ජ් පෙරේරා විපක්‍ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් විනාඩි 01 යි. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩි 02 ක් සහ කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩි 02 යි.

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ හරහා කියන්නේ. මීට පෙර සමෘද්ධිය තිබෙන කාලයේදී සමෘද්ධි රක්‍ෂණ සමාගමක් පිහිටුවන්න කටයුතු කරගෙන ගියා. මීට අමතරව සමෘද්ධිය මාර්ගයෙන් විවිධ ආයෝජන ක්‍රියා කලාපයන් කරන්න ගියා. ගරු සභාපතිතුමනි, මතක තියා ගන්න. අවංකව, සද්භාවයෙන් නම් මේ යෝජනාව ගෙන ආවේ, මේ රටේ දුගී දුප්පත්කම නැති කරන්න නම්

මීට වඩා මේ ආණ්ඩුවේ ඇමැතිවරු මීට වඩා සද්භාවයෙන් ජනතාවට පිළිබඳව මේ පනතින් ඉදිරිපත් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, (බාධා කිරීමක්) අපි දැක්කා ටැන්සානියාවේ -

(බාධා)

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාට කාලය වෙන් කරලා තිබෙනවා. එතුමා කථා කරන්න දෙන්න. ඔබතුමාගේ කථාවේදී ඒවාට උත්තර දෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, අපි දැක්කා ලෝකයේ දුගී දුප්පත්කම නැති කරන නායකයෝ. අපි දැක්කා ටැන්සානියාවේ ජූලියස් නියරේරේ ජනාධිපතිවරයා තමන්ගේ රටේ දුප්පත්කම නැති කරන්න කටයුතු කරපු හැටි. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා ලංකාවේ ජනසවිය පටන් ගත්තා. ඊට පස්සේ සමෘද්ධිය බවට පත් වුණා. රටේ දුප්පත් මිනිස්සුන්ගේ 13,500 ට මෙතුමන්ලාගේ ආණ්ඩුවෙන් පොල්ල තිබ්බා. ඊට පස්සේ අධිකරණයට ගිහිල්ලා තමයි දුප්පත් මිනිසුන්ගේ 13,500 අරන් දුන්නේ. ඒකට අපිත් එක්ක එදා උසාවි ගියේ අද ආණ්ඩුවේ ඉන්න ගාමිණී ලොකුගේ මැතිතුමා. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ සුනිල් ජයමිණි ගරු සභානායකතුමා දන්නවා. ගරු සභාපතිතුමනි, මේ නිසා ආණ්ඩුවට මේ පිළිබඳව සද්භාවයක් තිබෙනවා. මේ මොකක්ද වෙන්නේ ගරු සභාපතිතුමනි? මේකේ පූර්විකාවේ මොනවාද කියන්නේ? පූර්විකාවේ කියන කාරණය නොවෙයි සිද්ධ වෙන්නේ. පළාත් සභා සතු බලතල අද එක පවුලක් වටා කේන්ද්‍ර වීමේ න්‍යාය පත්‍රයක් තමයි අද ක්‍රියාත්මක වෙන්නේ. අද එක පවුලක් ශක්තිමත් කරලා, ඒ පවුල ආරක්ෂා කිරීම වෙනුවෙන් මේ රටේ දුප්පත් මිනිස්සුන්ව දන් දීමේ වැඩ සටහනක් තමයි මේක හරහා ක්‍රියාත්මක වෙන්නේ ගරු සභාපතිතුමනි. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මම මේ සභාවට ඉදිරිපත් කරන්නේ. මේක දිවි නැගුමද? දිවි නැසුමද? කියලා අපි අහනවා. මේ ජනතාවගේ දිවි විනාශ කරන එකක් මිස දිවි නගන කාරණයක් නොවෙයි. ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාවගෙන් 40% කගේ දවසේ ආදායම ඩොලර් දෙකකට අඩුයි. මේ ආණ්ඩුව යටතේ ඩොලර් එක පාවෙන නිසා දවසින් දවස නගිනවා. ඒක වෙනම කතන්දරයක් ගරු සභාපතිතුමනි. සමෘද්ධිලාභීන් ලක්ෂ 20 කගේ මුදල් ටික අරගෙන මේ කරන්න හදන්නේ මොකක්ද? EPF එකට අත තියන්න ගියා. එදා ජනතාව දිවි හිමියෙන් ඒක ආරක්ෂා කර ගත්තු නිසා ඒක කර ගන්න බැරි වුණා. අද මේ බිලියන 52 ආණ්ඩුවේ දේශපාලන න්‍යාය පත්‍රවල ආයෝජනය කරන්න තමයි ගරු සභාපතිතුමනි, මේ ක්‍රියාත්මක වෙමින් පවතින්නේ. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලනවා. පළාත් සභාවලට තව තවත් බලය බෙදන්න ඕනෑ මොහොතක. මම ඔබතුමා මාර්ගයෙන් ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, යෝජනාවක් ඉදිරිපත් කරන්න, පළාත් සභා අහෝසි කරන්නය කියලා. පළාත් සභා මෙහෙම තියෙනවාට වැඩිය හොඳයි අහෝසි කරලා දාලා ජනාධිපතිතුමාටත්, එතුමාට අවශ්‍ය අයටත් මේ බලතල ලබා ගන්න ඉඩ දෙන එක. මේක ඉතිහාසයේ අපි දැක්කා. (බාධා කිරීම්) මේ පළාත් සභාවේ ඇවිල්ලා ඉන්නවා -

(බාධා)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

මෙතුමා වාගේ -

**ගරු සභාපතිතුමා**

මට කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලාගේ මන්ත්‍රී කෙනෙක් තමයි බාධා කිරීම් කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

දුප්පත ජනතාවගේ -

**ගරු නිරෝෂන් පාදුක්ක**

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා සතු බලතල ගන්න මේ මහ ඇමැතිවරුන්ට අද කථා කරන්න සිද්ධ වෙලා තියෙනවා, මධ්‍යම රජයට. ඒ බලතල නැවතත් දෙන්න. මේ ක්‍රමය තුළ පළාත් සභා ක්‍රමය සුදු අලියෙක් බවට පත් කරන්න වක්‍රව මේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනාම අද හවසට අත උත්සනවා. තව පැයකින් අත උත්සනවා. මේක තමයි ගරු සභාපතිතුමනි, යථාර්ථය. මීට වැඩිය හොඳයි පළාත් සභා පනත අහෝසි කරන්න කියලා, ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා නැගිටලා මේ සභාවේ යෝජනා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. එහෙම කරන්නේ නැහැ ගරු සභාපතිතුමනි. අපි එක්සත් ජාතික පක්ෂයේ. අපි කැමැති නැහැ මේ පළාත් සභාව අහෝසි කරන්න. අපි අවසර දෙනවා. මේ විධියට පළාත් සභා සතු බලතල දවසින් දවස පැහැර ගන්න එපා. හොරකම් කරන්න එපා. වංචා කරන්න එපා කියන එක මේ ආණ්ඩුවට අපි කියා සිටිනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා තාවකාලිකව අත්හිටුවනවා. ගරු මන්ත්‍රීතුමන්ලා හැකිතාක් උත්සාහ කරන්න නියමිත වේලාවටම, පෙ.ව. 10.45 ට සභා ගර්භයට පිවිසෙන්න.

***ඊට අනුකූලව ..................***

**ගරු සභාපතිතුමා**

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 12 ක කාලයක් තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**

ගරු සභාපතිතුමනි, ඉතාමත් වැදගත් පනතක් බස්නාහිර පළාත් සභාව තුළ සාක- ඡා වන වෙලාවේ, දිවි නැගුම පනත ඉදිරිපත් කරමින් පළාත් සභාවේ අදහස් විමසන්නට අධිකරණය විසින් යොමු කරලා තිබෙන වෙලාවේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. 1995 අංක 30 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ඒ වාගේම 1996 අංක 18 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරීන් ඒකාබද්ධ කිරීම

තුළින් ඇති කරන දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාළව මේ පනත සම්බන්ධව පළාත් සභාවේ අදහස් විමසන්නට තමයි යොමු කරලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේ සභාවේ විපක්ෂයේ පාර්ශවයෙන් සඳහන් වුණා, පළාත් සභාවට මේ පනත යොමු කරන්නේ නැතුව ආණ්ඩුව හිතුවක්කාරී විධියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්න උත්සාහ කළාය කියන කාරණාය. ගරු සභාපතිතුමනි, සඳහන් කරන්නට ඕනෑ. ආණ්ඩුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට මේ පනත යොමු කරලා, නීතිපතිතුමාගේ අදහස් විමසීමෙන් පසුව තමයි පාර්ලිමේන්තුවට මේ පනත ඉදිරිපත් කරලා තිබෙන්නේ. නීතිපතිතුමා සඳහන් කරලා තියෙනවා, මේ පනත පළාත් සභාවත් එක්ක ගැටීමක් ඇති වෙන්නේ නැහැයි කියලා. ඒ අදහස නීතිපති දෙපාර්තමේන්තුව විසින් ආණ්ඩුවට ලබා දුන්නාට පසුව තමයි පාර්ලිමේන්තුවට මේ පනත ඉදිරිපත් කළේ. කිසියම් කොට්ඨාශයක් විසින් අධිකරණයට ගියාට පස්සේ අධිකරණයේ මතය වුණා, මේ පනත පිළිබඳව පළාත් සභාවල අදහස් විමසන්නට අවශ්‍යයි කියලා. එම තීරණය දීපු නිසා අද පළාත් සභාවට යොමු කරලා තිබෙනවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදී කරුණක් අනුව, අධිකරණයට තිබෙන ගරු කිරීම අනුව අතිගරු ජනාධිපතිතුමා ඒ තීන්දුව ලැබුණු විගස පළාත් සභාවලින් මේ පනත සම්බන්ධව අදහස් විමසන්න කියලා යොමු කරපු නිසා තමයි පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයෙන් මේ පනත ඉවත් කර ගත්තේ. පළාත් සභාවල අදහස් එනතුරු. ඒ නිසා මෙතැන වැරදි අර්ථ කථනයක් දෙන්න උත්සාහ කළා. මේ පනත පළාත් සභාවට ඉදිරිපත් කරන්නේ නැතුව කෙලින්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා මේ පළාත් සභාවේ තිබෙන බලතල උදුර ගන්නට, නැත්නම් බලතල අහෝසි කරන්නට, කප්පාදු කරන්නට උත්සාහ කරනවා කියන මතයක්, මේ සභාව තුළ, විපක්ෂය තුළ ඇති කරන්න හැදුවා. නමුත් ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී රජයක් හැටියට, ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන, අධිකරණයට ගරු කරන නායකයෙක් වන එතුමා වහාම පළාත් සභාවල අදහස් විමසන්නට යොමු කරපු නිසා තමයි ආණ්ඩුකාරතුමාගේ නියෝගය අනුව අද මේ සභාව කැඳවලා බස්නාහිර පළාත් සභාවේ මේ අදහස් විමසන්නට සූදානම් කරලා තිබෙන්නේ.

විශේෂයෙන් ගරු සභාපතිතුමනි, මේ පනත හරහා බලාපොරොත්තු වන මූලික කාරණය තමයි ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම හා ආරක්ෂිත සුරක්ෂිතභාවය ඇති කිරීම තුළින් ජනතාවට හොඳ ජීවන අවස්ථාවක් ඇති කරන්න පුළුවන් වාතාවරණයක් මේ රට තුළ ඇති කරන්න. විශේෂයෙන් දිවි නැගුම වැඩ පිළිවෙළ හරහා රටේ ආරක්ෂාව සුරක්ෂිත කරන වැඩ පිළිවෙළක් ආරම්භ කරලා දේශීය ආහාර, දේශීය ගොවියා සුරක්ෂිත කරන, නඟා හිටුවන වැඩ පිළිවෙළක් ආරම්භ කරලා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා දිවි නැගුම වැඩ පිළිවෙළ ආරම්භ කරලා ක්‍රියාත්මක කරන වෙලාවේ මුළු රටම මේ වැඩ පිළිවෙළට ඒකාබද්ධ කරගෙන, අර දෙපාර්තමේන්තු තුන තුළ ක්‍රියාත්මක කරපු ඒ විෂයයනුත් එකට අරගෙන මේ දිවි නැගුම දෙපාර්තමේන්තුව ඇති කරලා රටේ ජනතාවට ඉක්මන් ප්‍රතිලාභ ලැබෙන හොඳ වැඩ පිළිවෙළක්, සියල්ල ඒකාබද්ධ වුණු වැඩ පිළිවෙළක් ලෙස යන වැඩ පිළිවෙළක් තමයි මේ දෙපාර්තමේන්තුව ඇති කිරීම තුළින් ඇති කරන්න තමයි මේ ආණ්ඩුව උත්සාහ කරලා තිබෙන්නේ. ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මේ සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳව මහා දුකකින්

කථා කළා. සමෘද්ධි ප්‍රතිලාභීන්ට, සමෘද්ධි නියාමක නිලධාරී සේවක මහත්වරුන්ට මේ තුළ මහ අපරාධයක් සිද්ධ කරන්න මේ ආණ්ඩුව සූදානම් වෙනවා කියලා. මම මතක් කරන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. 2001 පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වෙලා, එක්සත් ජාතික පක්ෂය මේ රටේ බලය අරගත්තු වෙලාවේ 2001 සමෘද්ධි ව්‍යාපාරයට මොකක්ද වුණේ? කියලා අපි මතක් කරන්න කැමැතියි. මට මතකයි 2001 සමෘද්ධි අමාත්‍යාංශයේ හිටපු සේවකයින්ට ගැහුවා. සමෘද්ධි දෙපාර්තමේන්තුවේ හිටපු සේවකයින්ට ගැහුවා. සමෘද්ධි නියාමකයින්ට ගැහුවා. ඒ ගහලා ඒ අය තුළ මහා භීතියක් ඇති කළා. අපට මතකයි සමෘද්ධි නියාමක මහත්ම මහත්මීන්, ඒ නිලධාරී මහත්ම මහත්මීන් මහා භීතියකට පත් වුණා, ඔවුන්ගේ රැකියාව පිළිබඳව සුරක්ෂිත භාවයක් නැති බවට. ඔවුන් රැකියාවෙන් කොයි වෙලේ පයින් ගහලා දොට්ට දායිද කියන මහ බියක්, 2001 මේ රටේ පාලනය බලය ගත්තු වෙලාවේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඇති කළා. ඒ නිසා එහෙම අමතක කරලා කථා කරන්න උත්සාහ කරන්න එපා. අද සමෘද්ධි ව්‍යාපාරය පිළිබඳව මහ ආදරයකින් කථා කරන මේ උදවිය අපි මතක් කරන්න කැමැතියි -

**ගරු සිරිකමල්ද සිල්වා**

ජනසවියට මොකද වුණේ?

**ගරු ගුණසිරි ජයනාත්**

මෙන්න මේවාත් එක්ක උදාහරණ අරගෙන තමයි ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන, ජනතාවට ආදරය කරන නායකයෙක් හැටියට ඉන්න අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තනය 2005 ජනාධිපතිවරණයේ ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළ තුළ සමෘද්ධි නියාමක මහත්ම මහත්මීන්ගේ හැකියාවන් වන සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා ඒ අයට විශ්‍රාම සහිත රජයේ නිලධාරීන් බවට පත් කරන වැඩ පිළිවෙළ ආරම්භ කරන්න එතුමාට ප්‍රධාන හේතුවක් වුණේ. 2005 ජනාධිපතිවරණයේ මහින්ද චින්තනයේ දීපු පොරොන්දු පත්‍රය, ඒ ප්‍රකාශනය අනුව ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් කියන එක මම මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි. ඒ නිසා 2005 ජනාධිපති මැතිවරණයට ඉදිරිපත් කරපු මැතිවරණ ප්‍රකාශයෙනුත්, ඒ වාගේම 2010 මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම හරහා මේ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ තුළ අපි මතක් කරන්න කැමැතියි, මේ දෙපාර්තමේන්තු තුනේම සියලුම නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන් 27,000 කට ආසන්න ප්‍රමාණයක් සේවයට එක් වුණු දවසේ සිට ස්ථිර සේවයේ පිහිටුවන වැඩ පිළිවෙළක් මේ දිවි නැගුම දෙපාර්තමේන්තුව ඇති කිරීමත් එක්ක සිද්ධ වෙනවා කියන කාරණය.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මේ සමෘද්ධි බැංකු පිළිබඳව කථා කළා. සමෘද්ධි බැංකුවල තිබෙන මුදල් පිළිබඳව කථා කළා. අදහස් දක්වන්න උත්සාහ කළා. මේ ආණ්ඩුවේ ඇමැතිවරුන්ගේ දේශපාලන ව්‍යාපාර සඳහා මේ සමෘද්ධි බැංකුවල තිබෙන වත්කම්, මුදල් යොදා ගන්න භාවිතා කරන උපක්‍රමයක් කියලා. මේක සම්පූර්ණයෙන් වැරැදියි. දිවි නැගුම පනත හරියට කියෙව්වා නම්, මම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ ගරු සභාපතිතුමනි, මේ සමෘද්ධි බැංකු වෙනුවට ඇති කරන දිවි නැගුම බැංකු හරහා, දිවි නැගුම බැංකු කළමනාකරණය කරන්න, කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, සමෘද්ධි

බැංකුව ක්‍රියාත්මක කරද්දී එහෙම කළමනාකරණ මණ්ඩලයක් තිබුණේ නැහැ. ඒ නිසා මේ සමෘද්ධි බැංකුව වෙනුවට ඇති වන, නම පමණක් වෙනස් වන දිවි නැගුම බැංකු ව්‍යාපාරය ඇති කිරීම සඳහා, පාලනය කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයක් ඇති කරලා තිබෙනවා. ඒ මුදල්වල සුරක්ෂිතතාවය, වත්කම්වල සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා. එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, සමෘද්ධි බැංකු ක්‍රියාත්මක වෙද්දී, මහ බැංකුවේ නියෝජිතයෙක් හෝ මහ බැංකුවේ අධීක්ෂණයක් එතැන තිබුණේ නැහැ. මුදල් අමාත්‍යාංශයේ පාලනයක්, අධීක්ෂණයක් එතැන තිබුණේ නැහැ. නමුත් මේ දිවි නැගුම බැංකු ව්‍යාපාරය හරහා ඇති කරන, මේ නව දෙපාර්තමේන්තුවත් එක්ක ඇති වන බැංකු ව්‍යාපාරය හරහා මහ බැංකුවේත්, මුදල් අමාත්‍යාංශයේත් කළමනාකරණ මණ්ඩලයට නියෝජිතයෝ ඇතුළත් කරලා කිසියම් පාලනයකින්, වගකීමක් සහිතව තමයි මේ බැංකු ව්‍යාපාරය ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණය මම මතක් කරනවා. ඒ නිසා නෛතිකමය වශයෙන් මේක ශක්තිමත් කරලා තිබෙනවා. කාටවත් ඕනෑ විධියට ඒවා ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැති වන ආකාරයට. සමෘද්ධි අධිකාරියේ බැංකු ක්‍රියාත්මක වුණාට වැඩිය හොඳ නීතිමය භාවයක්, සුරක්ෂිතතාවයක්, ඒ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ වත්කම් ආරක්ෂා වන ආකාරයේ වැඩ පිළිවෙළක් මේ බැංකු ව්‍යාපාරය හරහා ඇති කරලා තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, බෙහොම ප්‍රජාතන්ත්‍රවාදී රජයක් හැටියට මේ සියලු කරුණු ආරක්ෂා වන ආකාරයට මේ දිවි නැගුම පනත ඇති කරලා රටේ ජනතාවට ඉක්මන් ප්‍රතිලාභ සුරක්ෂිත ආකාරයෙන් ලැබෙන, හොඳ ජීවන තත්ත්වයක් නගා සිටුවන වැඩ පිළිවෙළකට ක්‍රියාත්මක වෙන්න පුළුවන් ආකාරයට මේ දිවි නැගුම දෙපාර්තමේන්තුව ගොඩ නගලා ක්‍රියාත්මක කරන්න මේ රජය උත්සාහ කරනවා. ඒ නිසා මේ දිනවල විපක්ෂය උත්සාහ කරනවා, විවිධාකාරයේ විරෝධතාවයන් මේ රජය හරහා ගොඩ නගන්න. අපි දැක්කා, පසුගිය කාලයේ දිවි නැගුම පනත ඉදිරිපත් වන වෙලාවේ, අදහස් ප්‍රකාශ කරන වෙලාවේ විවිධ වෘත්තීය සමිති, විවිධ දේශපාලන පක්ෂ උත්සාහ කළා, මේ සමෘද්ධි නියාමක මහත්ම මහත්මීන් සහ දෙපාර්තමේන්තුවල සේවක මහත්ම මහත්මීන් පාරට බස්සලා මේ ආණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණ කරවන්න. අද විපක්ෂයට බැරි වෙලා තිබෙනවා, මේ ආණ්ඩුවට විරුද්ධව ගොවියෝ සහ කම්කරුවෝ පාරට බස්සලා උද්ඝෝෂණය කරවන්න. අපි දන්නවා, ජාත්‍යන්තරයත් එක්ක එන කුමන්ත්‍රණත් එක්ක අද ඊට වැඩිය උගත්, බුද්ධිමත් මට්ටමේ ඉන්න ඇතැම් පිරිස්, විවිධ NGO වල ආධාර මත අද ආණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණ ව්‍යාපාරවල නිරත වෙලා ඉන්නවා. ඒක අපි දන්නවා. නමුත් මේ සමෘද්ධි නියාමක මහත්ම මහත්මීන් සහ මේ දෙපාර්තමේන්තු තුනේ ඉන්න මහත්ම මහත්මීන්ව උද්ඝෝෂණවලට ගෙන්නන්න උත්සාහ කළා. මේ අයගේ වරප්‍රසාද කපා හරිනවාය. මේ අයට ලැබෙන්නට ඕනෑ පාරිතෝෂික මුදල් නැති වෙනවාය. අපි මතක් කරන්න ඕනෑ, මේ දෙපාර්තමේන්තුව ඇති කිරීම තුළින් ඒ අය මේ අධිකාරි තුනේ සේවයට ඇතුළත් වුණු මුල් දවසේ සිට මෙය දෙපාර්තමේන්තුවක් බවට පරිවර්තනයට වුණාට පසු ස්ථිර සේවයේ පිහිටුවන විශ්‍රාම වැටුප් ලබන වැඩ පිළිවෙළකට මේ රජය විසින් මේ දෙපාර්තමේන්තු ඇති කිරීමත් එක්ක ඇති කරලා තිබෙනවා. ඒ නිසා මේ විපක්ෂය මොනව කිව්වත්, අද ජනතාව සහ මේ අධිකාරී තුනේ හිටපු නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් යථාර්ථය අවබෝධ කරගෙන ඒ අය ඉල්ලා සිටි ස්ථිර භාවය මේ රජය විසින් ලබා දීලා

තිබෙනවා. ඒ නිසා අද විපක්ෂය කිඹුල් කඳුළු හෙලුවාට වැඩක් වෙන්නේ නැහැ.

**ගරු සිරිකමල් ද සිල්වා**

ඕක මහින්ද චින්තනයේ කීවෙනි පිටුවේද තියෙන්නේ?

**ගරු ගුණසිරි ජයනාත්**

ඔබතුමා මහින්ද චින්තනය බලන්න. මහින්ද චින්තනය බලන්න. ඔබතුමාට බලාගන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, අද මේ රටේ ලක්ෂ 15 1/2 ක් පමණ වන සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වලට මේ රජය ඒ අයගේ අයිතීන්, ඒ අයගේ වරප්‍රසාද, ඒ අයගේ මුදල් සුරක්ෂිත කරලා, ඒ බැංකු නීත්‍යානුකූල තත්ත්වයකට ගෙනැල්ලා මුදල් අමාත්‍යාංශයේත්, මහ බැංකුවේත් පාලනයක් ඇති කරලා කාටවත් මේ විපක්ෂය කියන විධියට හොරකම් කර ගන්න බැරි වන විධියට, මූල්‍ය පාලනයක් ඇතුව ඒ අයගේ මේ බැංකු කටයුතු ක්‍රියාත්මක කර ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරලා තියෙනවා. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න ඕනෑ. මේ සමෘද්ධි ව්‍යාපාරය හරහා ඉන්න උදවියට වාණිජ බැංකුවලින් යම් සේවාවක්, බැංකු කටයුත්තක් කර ගන්න ගියාම විශාල අපහසුතාවයන් ඇති වෙනවා. ඒ නිසා තමයි සමෘද්ධි ව්‍යාපාරය හරහා ඇති කරගෙන ආපු මේ බැංකු ව්‍යාපාරය, අද දිවි නැගුම බැංකු ව්‍යාපාරය තුළ ස්ථානගත කරලා ඒ තුළින් ඒ අයගේ අවශ්‍යා සේවාවන් සහ පහසුකම් කඩිනමින් ලබා ගැනීමේ හැකියාවක් ඇති කරලා තිබෙනවා මේ දිවි නැගුම දෙපාර්තමේන්තුව ඇති කිරීම තුළ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ සමෘද්ධි ප්‍රතිලාභ ලබන ජනතාව - අද එදා වගේ නොවෙයි. 1995 සමෘද්ධි ව්‍යාපාරය ඇති කරන වෙලාවේ මේ රටේ සමෘද්ධි ව්‍යාපාරයට ඇතුල් වුණු ප්‍රතිලාභීන් අද වනකොට ඉතා දියුණු තත්ත්වයකට පත් වෙලා. යම් පිම්මක් ඒ අය ඉදිරියට පැනලා ඉන්නවා. ඒ නිසා අද ඒවාත් එක්ක බලලා, කල්පනා කරලා ඉදිරිය ගැන හිතලා තමයි දිවි නැගුම දෙපාර්තමේන්තුව ඇති කරලා, තිබුණු අධිකාරීන් තුන එකට එකතු කරලා ඒ සියලු ආයතනවල ක්‍රියාත්මක වුණු සේවාවන් විධිමත් කරලා ඒවායේ තිබුණු අඩුපාඩු මග හරවලා තව තවත් හොඳ යථා තත්ත්වයකට පත් කරන්න හදන්නේ. මේ දෙපාර්තමේන්තුව ඇති කරලා ක්‍රියාත්මක කරන්නේ ඒ නිසා. පළාත් සභාවත් එක්ක මේ විෂයය, මේ දෙපාර්තමේන්තුවේ කටයුතු ගැටෙන්න කිසිම හේතුවක් නැහැ. ඒ නිසා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ දිවි නැගුම දෙපාර්තමේන්තුව ඇති කිරීම තුළින් රටේ ජනතාවගේ ජීවනෝපාය මාර්ග ඉතා ඉහළ තත්ත්වයකට පත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් දිවි නැගුම දෙපාර්තමේන්තුව හරහා ඇති කරලා තිබෙනවා කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නලින්ද ජයතිස්ස**

ගරු සභාපතිතුමනි, මේ දිවි නැගුම පනත සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම සම්න්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පනතේ අන්තර්ගතයට අවධානය යොමු කරන්න ඉස්සර වෙලා මේ පනත හදිසියේ ගේන්න ආණ්ඩුව කල්පනා කළේ ඇයි කියන එක පිළිබඳව සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. ඒ මොකද, එක පැත්තකින් ගත්තොත් එහෙම එක්කෝ සමෘද්ධි අධිකාරිය, එහෙම නැත්නම් උඩරට

සංවර්ධන අධිකාරිය, දක්ෂිණ සංවර්ධන අධිකාරිය මේ අධිකාරී තුන අසාර්ථක නම් ඒ අසාර්ථක ව්‍යාපෘතියේ යම් සාර්ථකත්වයක් ලබා ගැනීම සඳහා මෙවැනි එකක් ගේන්න ආණ්ඩුවට ඉඩකඩ තිබුණා. ඒ වාගේම තමයි එක්කෝ දිවි නැගුම ව්‍යාපෘතිය සාර්ථකව රටේ ක්‍රියාත්මක වුණා නම් ඒ ව්‍යාපෘතිය කාර්යක්ෂම කර ගැනීම සඳහා මෙවැනි පනතක් ගේන්න උවමනාව තිබුණා. හැබැයි, අපි දකිනවා මේ අධිකාරී තුනේ යම් ප්‍රමාණයකට වැඩ කටයුතු කරමින් හිටියා. එහි දේශපාලන බලපෑම් සියල්ල තියෙද්දී වැඩ කටයුතු කරමින් හිටියා. ආණ්ඩුවට ඒවා කාර්යක්ෂම කරන්න උවමනාවක් නැහැ. ඒ වාගේම තමයි දිවි නැගුම සාර්ථකව ගියෙත් නැහැ. කවුරු හරි කියනවා නම් එහෙම දිවි නැගුමෙන් ඇට පැකට් ටිකක් බෙදලා, පොහොර පැකට් ටිකක් බෙදලා රටේ කෘෂිකර්මාන්තය සංවර්ධනය කළාය කියලා. නැහැ. ඒක හැම දෙනාම දන්නවා. එහෙම එකක් වුණේ නැහැයි කියලා. එහෙම නම් මේ පනත හදිසියේ ගේන්න තිබෙන උවමනාව මොකක්ද? දැන් මේ පළාත් සභාව රැස් කළෙත් හදිසියේ. ඒ වාගේම තමයි මේ අවුරුද්දේ අගෝස්තු මාසේ 10 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, අගෝස්තු 24 වැනිදා හදිසියේ සම්මත කර ගන්න තමයි ආණ්ඩුව සූදානම් වෙලා හිටියේ. ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිතිය අධිකරණය ඉස්සරහාට ගිහිල්ලා මෙහි තිබෙන නීති විරෝධී භාවය පිළිබඳව කරුණු ඉදිරිපත් කළාට පස්සේ අධිකරණයට කියන්න සිද්ධ වුණා, මේ පළාත් සභාවල අදහස් විමසන්න කියලා. අපට කනගාටුයි, මේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා සමෘද්ධි වෘත්තීය සමිතියේ ලොක්කෙක්. අඩු තරමින් එතුමාගෙන්වත් ඇහුවා නම්. මම දන්නේ නැහැ, පළමුව මේක පළාත් සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ කියලා එතුමා දන්නවාද කියලා. එතුමාගෙන් ඇහුවා නම් දැන ගන්න තිබුණා, මේක පළාත් සභාවලට ඉස්සෙල්ලා ගේන්න ඕනෑ කියලා. දැන් අර ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළා. නීතිපතිතුමා කිව්වා මේක පළාත් සභාවට ඕනෑ නැහැ කියලා. අපි අහනවා ගරු මන්ත්‍රීතුමා, නීතිපති දෙපාර්තමේන්තුව දැන් කා යටතේද තියෙන්නේ? රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට නීතිපති දෙපාර්තමේන්තුව ජනාධිපතිවරයා යටතට පවරා ගත්තා. දැන්

*මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.*

යටතේ තමයි ඔය නීතිපති දෙපාර්තමේන්තුව තියෙන්නේ. ඔය නීතිපති දෙපාර්තමේන්තුවෙන්ද කිව්වේ? ඒ නිසා මෙය හදිස්සියේ ගෙනාපු එකක්. තමුන්නාන්සේ කල්පනා කරලා බලන්න ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ජනාධිපතිතුමා පිළිබඳව කථා කිරීම -

**ගරු නලින්ද ජයතිස්ස**

මම කිව්වේ එතුමාගේ යටතේ තිබ්බා කියලා.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා නමත් කිව්වා.

**ගරු නලින්ද ජයතිස්ස**

ඒක වැරැදි නැහැ.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා නමත් කිව්වා. ඒ නිසා මම එය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

මේ පනත එවලා තියෙන්නේ ජනාධිපතිතුමා

**ගරු නලින්ද ජයතිස්ස**

ඊළඟට ආණ්ඩුව පසුගිය කාලය තිස්සේ මෙවැනි තදියමකින්, හිතුවක්කාරකමකින්, හදිසියේ මෙවැනි පනත් ගෙනාවේ කොයි වෙලාවටද? ඔන්න EPF, ETF විශ්‍රාම වැටුප් කොල්ලකන පනතක් සූදානම් කරනවා. EPF, ETF කොල්ලකන පනත හදිසියේ ගෙනාවා. ඒ වාගේම තමයි විධායක ජනාධිපති ධූරයේ වාර ගණන වැඩි කරන 2/3 බලය දාගෙන ඒ වැඩි කරන 18 වැනි සංශෝධනය හදිසියේ ගෙනාවා. අපි කල්පනා කරන්නේ, මේකත් ගේන්නේ මේ රටේ ජනතාවටත්, සමෘද්ධි නිලධාරීන්ටවත්, සමෘද්ධි ලබා ගන්න මේ දුප්පත් සමෘද්ධිලාභීන්ටවත් කරන සේවයක් කරන්න නොවෙයි. මෙය වස්තුකාමයෙන් ගෙනාපු පනතක්. වස්තුකාමය නිසා. ඇයි? දැන් ආණ්ඩුව කල්පනා කරනවා කොහේද සල්ලි තියෙන්නේ? ඒ ටික ගන්න ඕනෑ. ඒ නිසා මේ සමෘද්ධි නිලධාරීන් 25,000 කගේ EPF, ETF තියෙනවා, රුපියල් කෝටි 2500 කට ආසන්න මුදලක්. ඒ වාගේම සමෘද්ධි බැංකුවල තිබෙනවා රුපියල් කෝටි 5000 කට ආසන්න මුදලක්. මේ රටේ කෝටි 7500, 8000 ක් තියෙනවා තැන්පත් වෙලා. මේ ටික ගැනීම සඳහා ගොනාපු ව්‍යාපෘතියක්. නැත්නම් වෙන එකක් නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණේ අපි ඒ වාගේම අපේ වෘත්තීය සමිතිය බොහොම පැහැදිලිව කිව්වා - සමෘද්ධි සේවකයෝ බඳවා ගත්තු එක පිළිබඳව අපට විවිධ දේවල් තියෙයි. හැබැයි, කෙසේ බඳවා ගත්තත් ඒ සමෘද්ධි නිලධාරීන් රජයේ අමාත්‍යාංශයක් යටතට අරගෙන දෙපාර්තමේන්තුවක් යටතට අරගෙන ඒ අයට විශ්‍රාම වැටුපක් දෙන්න ඕනෑ කියලා. විශ්‍රාම වැටුපක් දෙන්න ඕනෑ. (බාධා කිරීම්) හැබැයි අපි අහනවා, මොන අමාත්‍යාංශයේද -

[සභාවේ ඝෝෂා]

ඔබතුමා ඉන්න. මොන අමාත්‍යාංශයේද විශ්‍රාම වැටුපක් දෙනකොට තමන් දීපු EPF, ETF සැලකිල්ලට ගන්නේ? මේ මොකක්ද මේ තියෙන්නේ? 25 (1) වගන්තිය,

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මූලාසනයට කථා කරන්න. අනවශ්‍ය ගැටුම්වලට යන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**

25 (1) වගන්තිය,

එම නිලධරයන් සහ සේවකයන් විසින් (බාධා කිරීමක්) මොකටද මාධ්‍ය ගෙනැල්ලා තියෙන්නේ?

**ගරු සභාපතිතුමා**

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු නලින්ද ජයතිස්ස**

මොකටද මාධ්‍යයට එන්න කිව්වේ?

*එම නිලධරයන් හා සේවකයන් විසින් සේවක අර්ථ සාධක අරමුදලට ගෙවන ලද යම් අරමුදලක් සහ අධිකාරිය විසින් මෙම සේවක අර්ථ සාධක අරමුදලට ලබා දෙන ලද දායකත්වය සැලකිල්ලට ගෙන,*

**(සම්බන්ධය නිවැරැදියි)**

## 2 දැමිය යුතුයි

**නන්දසිලී පෙරේරා**

**(රේණුක පෙරේරා)**

මේ පනත සම්මත වූ වහාම අලුත් පත්වීම් ලබා දෙනවයි කියන එක සහතික කරලා අපි කියනවා සභාපතිතුමනි. උපාධිධාරීන් පහළොස් දහසකට නව පත්වීම් ලැබෙනවා. ගරු සභාපතිතුමනි, මේ විවේචනයක් ඉදිරිපත් කරමින් කිව්වා (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**

කරුණාකර දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා. එතුමාට එහෙම කරන්න නරකයි.

[සභාවේ ඝෝෂා]

**ගරු රේණුක පෙරේරා**

අපේ සිරිකමල් මන්ත්‍රීතුමා විමසා සිටියා මහින්ද චින්තනයේ මේ සමෘද්ධි ව්‍යාපාරයට මෙහෙම දෙයක් කරනවා කියලා කොහේද තිබුණේ කියලා. මම හිතන්නේ එතුමා කියවලා නැහැ. මහින්ද චින්තනය කියෙව්වා නම් එතුමා ඔතැන ඉන්නේ නැහැ නේ? මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මහින්ද චින්තනයේ 19 වැනි පිටුවේ සමෘද්ධිලාභී පවුල් පිළිබඳව කියන එකේ හත්වැනි වගන්තියට යන්න. හත්වැන වගන්තියේ පැහැදිළිව කියලා තියෙනවා මහින්ද චින්තනය ඉදිරි දැක්මේ සමෘද්ධි පවුල්වල ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා හා ජීවනෝපාය කටයුතු සංවර්ධනය වර්ධනය කිරීම පහසු වන පරිදි සමෘද්ධි අධිකාරියේ සේවකයන් විශ්‍රාම වැටුප්වලට හිමිකම් කියන රාජ්‍ය සේවකයන් බවට පත් කිරීමට අවශ්‍ය සේවා ව්‍යවස්ථාවක් සකස් කරන්නෙමි කියලා. පැහැදිළිව මහින්ද චින්තනයේ කියලා තියෙනවා. මේ මහින්ද චින්තනයේ කියපු වැඩපිළිවෙළ පැහැදිළිව මේ දිවිනැගුම පනත තුළින් අද ඉදිරිපත් කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, මේ දිවිනැගුම කියන්නේ ජන සවි මල්ල නොවෙයි. ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මහත්තයා කිව්ව ඇට රාත්තල් අට නොවෙයි. ඊට එහා ගිය දැවැන්ත දැක්මක් ඇති වැඩ පිළිවෙළක්. කවුද මන්ත්‍රීවරයෙක් කිව්වා, දිවිනැගුම අසාර්ථක නිසාද මෙය ගේන්නේ කියලා. නැහැ. දිවිනැගුම සාර්ථකත්වය මම

ඔබට කියන්නම්. ගරු සභාපතිතුමනි, මේ රටේ බිත්තර නිෂ්පාදකයකයින් රජයට මීට අවුරුදු දෙකකට කලින් අභියෝග කළා, බිත්තරයක මිල රුපියල් විසිපහකට වැඩි කරන්න ඕනෑය කියලා. ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ මේ රටේ කුකුල් පැටවුන් බෙදා දීලා මේ රටේ බිත්තර නිෂ්පාදනය ඉහළ නංවලා ඒ අද වෙළඳ පොලේ බිත්තර මිල පාලනය කරන්න පුළුවන්කමක් ලැබිලා තියෙනවා. ඒ වාගේම තමයි ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා සෑම ග්‍රාම සේවා වසමකම පවුල් ඒකක 200 ක් සඳහා දිවිනැගුම යටතේ බීජ බෙදා හැරලා, පැළ බෙදා දීලා ගෘහ ආර්ථිකය ශක්තිමත් කරමින් එළවළු නිෂ්පාදනය වැඩි කළා. ඒ නිසා අද දඹුල්ල වෙළඳපලේ ගොවීන්ට තමන්ට හිතුමතේ මිළ ඉහළ නංවන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. කොළඹ නගරයේ ජිවත්වන නාගරික ජනතාව පවා අද තමන්ට අවශ්‍ය එළවළු නිෂ්පාදනය කරලා තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කරලා තියෙනවා. දිවිනැගුම යටතේ අපි බලාපොරොත්තු වෙනවා ගරු සභාපතිතුමනි, මාගේ කොලොන්නාව මැතිවරණ කොට්ඨාශයේ ඔබ යන එන කැළනි පාලම යට ඉන්න අහිංසක දිළිඳු ජනතාව දිහාමම අවධානය යොමු කරන්න කියනවා. ඒ ජනතාව හඳුන්කූරු නිෂ්පාදනය කරලා ජීවත් වෙන්නේ. ඔවුන්ට පුළුවන්කමක් නැහැ කිසිදු බැංකුවකින් මූල්‍ය පහසුකම් ලබා ගන්න. ඒ හඳුන්කූරු නිෂ්පාදකයින්ට, කිරි ගොවිතැන් කරලා අහිංසක මිනිස්සුන්ට එහෙම නැත්නම් ඉඳිආප්ප නිෂ්පාදනය කරලා අලෙවි කරන මිනිස්සුන්ට මේ කිසිදු බැංකුවකින් ආධාරයක් දෙන්නේ නැහැ. කිසිම බැංකුවකට ගොඩවෙන්න දෙන්නේ නැහැ. ලෙඩක් හැදුනොත් මේ බැංකුව විතරයි. ඒ නිසා තමයි ශුද්‍ර මූල්‍ය බැංකු ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ. මේ බැංකුව තුළ කිසිම ඇපකාරයෙක් අවශ්‍ය වන්නේ නැහැ. කිසිදු වත්කමක් තමුන්ගේ ඇපයට තියන්න අවශ්‍ය වන්නේ නැහැ. අහිංසක මිනිසුන්ගේ ආර්ථිකය වර්ධනය කර ගන්න අවශ්‍ය ආර්ථික ශක්තිය ළඟා කර ගන්න පුළුවන් ආධාර දීමේ වැඩසටහන් මේ ව්‍යාපෘතිය තුළින් ක්‍රියාත්මක කිරීමට බැසිල් රාජපක්ෂ මැතිතුමා සැළසුම් කරලා තියෙනවා. ඒකට තමයි දිවිනැගුම ව්‍යාපෘතිය ගෙනැල්ලා තියෙන්නේ. මෙය දිවිය නගා සිටුවන්න දිවිනැගුම තුළින් ක්‍රියාත්මක කරන්නේ අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තනයය යටතේ මේ රටේ ජනතාවට දුන්නා වූ පොරොන්දුව අහිංසක දිළිඳු ජනතාවගේ දුප්පත්කම තුරන් කරලා ඒ අයව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් - (බාධා කිරිම්)

**ගරු ශ්‍රීනාත් ම පෙරේරා**

............. ආයෝජනය කරන්න යන්න එපා

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට තව විනාඩියක කාලයක් තියෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

මෙතුමා ප්‍රශ්නයක් ඇහුවා.

**ගරු සභාපතිතුමා**

නැහැ. නැහැ. උත්තර දෙන්න අවශ්‍ය නැහැ. ප්‍රශ්නයට උත්තර දෙන්න වේලාවක් නැහැ.

**ගරු ශ්‍රීනාත් ම පෙරේරා**

ඔබතුමා මට විනාඩියක් දෙන්න එතුමාට උත්තර දෙන්න.

**ගරු සභාපතිතුමා**

එහෙම දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් ම පෙරේරා**

ගරු සභාපතිතුමනි,

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී***

(බාධා කිරීම්)

**ගරු රේණුක පෙරේරා**

අපේ රෝස් මන්ත්‍රීතුමිය ගර්භණී මවට දෙන පෝෂණ මල්ල ගැන අහනවා. අපි දන්නේ නැහැ, එතුමිය ගර්භණී තත්ත්වයට අවිවාහකව පත් වුණාද කියලා.

**ගරු ශ්‍රීනාත් ම පෙරේරා**

පෝෂණ මල්ල කොහේද කියලා හිරුණිකා පෙන්වයි.

**ගරු රේණුක පෙරේරා**

ගර්භණී මාතාවට දෙනවා . රෝස් මන්ත්‍රීතුමිය ගර්භණී තත්ත්වයට පත් වුණාද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තියෙනවා.

**ගර රේණුක පෙරේර**

ගරු සභාපතිතුමනි, හැමදාම දිළිඳු ජනතාව රවට්ටන එක තමයි කළේ. මේ සුදු අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේ යුද්ධයන් සඳහා මේ රටේ අපෙ මිනිස්සුන්ට බජරි බෙදා දීම සඳහා මේ සලාක ක්‍රමය ආරම්භ කළා. ඒ සලාක ක්‍රමය ඊට පස්සේ හාල් පොත දක්වා ආවා. ඊට පසුව හාල් පොත අවලංගු කරලා ඇට දෙන්නම් කියලා ජේ.ආර්. ජයවර්ධන මහත්තයාගේ ආණ්ඩුව ඊට පස්සේ කාඩ් එකක් දුන්නා. අන්තිමට ඒ කිසිම ඇටයක් නැතුව ජේ.ආර්. ජයවර්ධන මහත්තයාට යන්න වුණා. ඊට පස්සේ ප්‍රේමදාස මහත්තයා ආවා. ප්‍රේමදාස මහත්තයා ජනසවි මල්ලක් දෙන්නම් කිව්වා. ජන සවි මල්ල තමන්ගේ පාක්ෂිකයින් අතලොස්සකට බෙදලා ඒ අහිංසක මිනිස්සුන්ගේ රුපියල් 250 ක තැන්පතුව කපා ගෙන. සජිත් ප්‍රේමදාස මහත්තයාවත් අද දන්නේ නැහැ, ඒ සල්ලිවලට වුණු දෙයක්. ඊට පස්සේ අපි සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කළා. අපේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් තමන්ගේ ගමට ගිහිල්ල ගමේ ජනතාවගේ දිළිඳු බව අවබෝධ කර ගෙන වැඩසටහන් සකස් කරලා ආර්ථික ශක්තියක් ඒ ජනතාවට ලබා දීලා අද සමෘද්ධි ව්‍යාපාරය යම් ශක්තිමත් භාවයකට ඇවිල්ලා තියෙනවා. ඒ නිසා ඒ ක්ෂේත්‍රයන් තුනම ඒ පනත් තුළින් පිහිටුවන ලද ආයතන සියල්ලම ඒකරාශී කරලා අධිකාරීන් වෙනුවට දෙපාර්තමේන්තු බවට පත් කරලා තියෙනවා.

ඒ දෙපාර්තමේන්තුව තුළ මුල්‍ය රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට යටත්ව මේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන්නේ. අධිකාරියක වාගේ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට ඕනෑ හැටියට තීන්දු තීරණ ගන්න පුළුවන්කමක් නැහැ. දෙපාර්මේන්තු රෙගුලාසි යටතේ ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයටත්, ජනතා විමුක්ති පෙරමුණටත් මේ පනතට විරුද්ධ වෙනවා හැරෙන්න ඔවුන්ට කරන්න දෙයක් නැහැ. තමන්ගේ පක්ෂයට නායකයාට හැමදාම විරුද්ධ වන එක්සත් ජාතික පක්ෂය මේ පනතට විරුදධ වීම ස්වාභාවිකයි කියමින් ඔබතුමාට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ දීර්ඝ කාලයක් පැවතුණු හැම රජයකින්ම මේ රටේ තැලෙන, පොඩිවෙන, මිරිකෙන එහෙම නැත්නම් ආර්ථික දරිද්‍රතාවයෙන් පීඩනයට පත් වූ ජනතාව සුඛිත, මුදිත කරලීමේ මහඟු වැඩ පිළවෙළවල් කිහිපයක්ම මේ රටේ ක්‍රියාත්මක කළා. ඒ සම්බන්ධව දීර්ඝ වූ අදහස් රැසක් මේ ගරු සභාවේ ලාන්සා ඇමතිතුමාගේ සිට අනෙකුත් අපේ සහෝදර මන්ත්‍රීවරු රැසක්ම ඉදිරිපත් කළා. මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, රජයක් හැටියට දේශපාලන ඇහැකින් නොබලා පක්ෂ, පාට කණ්ණාඩියකින් බලන්නේ නැතුව, මේ රටේ දරිද්‍රතාවයෙන් පෙලෙන අහිංසක දුප්පතුන් නගා සිටුවීමේ සාර්ථක ක්‍රමවේදයක් ගොඩනැගීම රජයක විශාල වගකීමක් කියලයි මා විශ්වාස කරන්නේ. මේ වගකීම කලින් අපේ රේණුක පෙරේරා සංවිධායකතුමා කිව්වා වාගේ හාල් පොතක් හැටියට ආවා. භූමිතෙල් මුද්දරය හැටියට ආවා. ඒකේ කෙළවර මේ පහුගිය කාලයේ මීට දශක තුනකට පෙර විතර මට අදත් මතක් වුණා, හම්බන්තොට වයලට් අක්කාගේ ලව්ඩ්ස් පීකර් එක බෙත්මගේ මන්ත්‍රීතුමනි. මට ඒ කාලය මතක් වුණා. ඒ කාලයේ සභාපතිතුමනි, රූපවාහිනිය කොළඹ නගරයට විතරයි සීමා වෙලා තිබුණේ. රූපවාහිනිය ඈත දුෂ්කර ගම්බද ප්‍රදේශවලට තිබුණේ නැහැ. ජන සවිය ගෙනාවාම ජන සවියේ තිබුණු මූලික හරය, සංකල්ප, පරමාර්ථ සැහෙන ප්‍රමාණයක් හොඳ මට්ටමට තිබුණාය කියලා මම පිළිගන්නවා. හැබැයි, එක දෙයක් පිළිගන්නට ඕනෑ. ජන සවිය තනිකරම පාට කණ්ණාඩියකින් බලලා, එක්සත් ජාතික පාක්ෂිකයන් පමණක් නගා සිටුවීමේ වැරදි සහගත ක්‍රමවේදයකට ජන සවිය සකස් කරලා තිබුණා. ඒ වැඩසටහනට සමීක්ෂණ නිලධාරියෙක් හැටියට මම ගියා. කොළඹ විශ්ව විද්‍යාලයේ ඉන්න කාලයේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියා. අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට ගියා. හෝමාගමට එහායින් තියෙන හංවැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට ගියා. හම්බන්තොට බල ප්‍රදේශයට ගියා. ඒ කාලයේ ඒ පළාතේ හිටපු ප්‍රාදේශීය ලේකම්වරයා තමයි වාස් ගුණවර්ධන . මට අද වාගේ මතකයි. මම මිනිස්සු අතරට ගිහිල්ලා මේ සමීක්ෂණය හොයලා බලද්දි මට දැනුණු ඉතාම අමිහිරි - මූලික වශයෙන් මේ වාගේ දුප්පතුන් නගා සිටුවීමේ ක්‍රමවේදයක් සහමුලින්ම කණපිට හරවලා පාක්ෂිකයින් නගා සිටුවීමේ ක්‍රමවේදයකට සියලු කාරණා ලකලැහැස්ති කර ගෙන තිබුණා. කිසියම් තැනක, මට මතකයි බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ, නිමල් පීරිස් මන්ත්‍රීතුමනි, ලොකු ප්‍රදර්ශණයක් තිබුණා. මේකෙ තිබුණා ගරු සභාපතිතුමනි, විශාලම මයියොක්කා අල පඳුරක්

ගෙනැල්ලා. මේක ගෙනාවේ කොබෙයිගනේ ගොවියෙකුගෙන්. පුද්ගලික ගෙදරකින්. මේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ සත්ත්ව ගොවිපලවල් හදලා තිබුණා. එහෙම නැත්නම් කෘෂිකාර්මික ගොවිපලවල් හදලා තිබුණා, තාක්ෂණික ප්‍රදර්ශණයට. මේ සත්ත්ව ගොවිපලවල හදලා තිබුණේ, ගෙවල් දහයකින් පහළොවකින් ශක්තිය එකතු කරලා. බෝඩ් එකක් ගහලා එතැන කියනවා මෙන්න ජන සවියේ තිබෙන ප්‍රවර්ධනය. ජන සවිය නගා සිටෙව්ව ගොවියා. සත්ත්ව ගොවියා නගා සිටෙව්වා කියලා තමයි පෙන්නුවේ. මම දැක්කා. ඒ උදවිය මම පුද්ගලිකව හම්බ වුණා. ඒ කාලයේ මාළු මිරිස් කරල් අමුණලා ඇමතිතුමනි, මේ ජන සවිය යටතේ ප්‍රදර්ශනය කළා. මම විපක්ෂයෙන් පැන නැගුණු තිබුණ විවිධ චෝදනා අහගෙන හිටියා. මේ රුපියල් විසිපන්දහසේ කථාව. විශේෂයෙන් ලංකාව පුරා ජන සවිය ක්‍රියාත්මක වුණා. මම හිතන්නේ බොහොම සුළු ප්‍රමාණයක් විතරයි ක්‍රියාත්මක නොවුණේ. උතුරු ප්‍රදේශයේ. හැම තැනම රුපියල් විසිපන්දහසක ස්ථාවර තැන්පතුවකට ගොනු කළා. අපි පිළිගත යුතු දෙයක් තියෙනවා. ලෝකයේ ඕනෑම රටක පීඩිත මිනිසුන් ඇති හැකියවුන්, එහෙම නැත්නම් ස්වශක්තියෙන් නගා සිටුවන්නට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම් මුල්‍ය බැංකු ක්‍රමය වැදගත් වෙනවා. ඒ නිසාවෙන් තමයි මෙ ජන සවිය හරහා මුල්‍ය තැන්පතුව විසිපන්දහසක් කළේ. මම දැක්කා බැංකුවට ගියාම කාඩ් එක අරගෙන අහිංසක අම්මලා, හැඹිලියේ තිබුණු රුපියල් පහ වෙන්න පුළුවන් දහයවෙන්න පුළුවන්. ජන සවියෙන් එකතු කරලා කාඩ් එකේ ලකුණු කරලා තිබුණා සභාපතිතුමනි, ඔබට රුපියල් විසිපන්දාහක ගිණුමක් තියෙනවා. ස්ථාවර මුදලක් තිබෙනවා. මේ ස්ථාවර මුදලේ පොළිය මෙපමණයි කියලා තමයි තිබුණේ. ඒ කාලයේ බැංකුවට ගියාම විකුම් ගුණසේකර මන්ත්‍රීතුමනි, අහිංසක ගමේ ගොවියා. අතට කරගැට ආපු ගෙවිලියො, මම දැකපු දෙයක් තමයි බැංකුවට ගියාම පුස්සක් වෙලා තිබුණා. විසිපන්දහසක තියා රුපියල් පන්දහසක්වත් තිබුණේ නැහැ. බඩු මල්ලක් දීලා නිකමුන් බවට පත් කරලා, ගෙදර ඉඳගෙන බඩු මල්ල කාලා ඉවර වෙලා ඒ කාලයේ තිබුණු වහල් ක්‍රමය, පාරෙ වැඩ කරන ක්‍රමය තමයි ජන සවියේ තිබුණේ. මේ වැරදි අඩුපාඩුකම් දැකලා තමයි, 1995 ශ්‍රී ලංකා සමෘද්ධි සංවර්ධන අධිකාරිය ගෙනාවේ. මේ සමෘද්ධි සංවර්ධන අධිකාරිය, එහෙම නැත්නම් උඩරට සංවර්ධන අධිකාරිය, දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරිය එකතු කරලා අද මේ අතිගරු ජනාධිපතිතුමා මහින්ද චින්තන වැඩපිළිවෙළ තුළ ගරු බැසිල් රාජපක්ෂ ඇමැතිතුමා – මම පුද්ගලිකව විශ්වාස කරනවා මේ රටේ මහින්ද චින්තන වැඩපිළිවෙළ තුළ ඉතිහාසගත වන ඇමතිවරයෙක් බවට පත් වෙනවා. ඉතාම සාර්ථක, ඉතාම නිවැරදි සැලසුම් සහගතව හෙට දවසේ මේ රටේ අනාගතය දකින්නට පුළුවන් මහින්ද චින්තනය තුළ, මේ රටේ තැලෙන, පොඩිවෙන, පෑගෙන මිනිසුන් ස්වශක්තියෙන් නගා සිටුවීමේ මහඟු, නිවැරදි සැලසුම් සහගත පනතක් ලෙසයි ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙය පාර්ලිමේන්තුවට හෙට අනිද්දාට ඉදිරිපත් කරන්නේ. අපේ අධිකරණයෙන් අපට ලබා දීලා තිබෙන නියෝගය අනුව මේ පළාත් සභාවේ කිසි කෙනෙක් භය වෙන්නට ඕනෑකමක් නැහැ. පළාත් සභාවේ බලතල මේ පනත මගින් කිසිදු දවසක උල්ලංඝනය වන්නේ නැහැ. අද සමෘද්ධි නිලධාරීන් හැටියට සේවය කරන එහෙම නැත්නම් උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කරන, එහෙම නැත්නම් දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරියේ සේවය කරන

සේවයේ අස්ථිර භාවයේ සිටින සේවකයන් තිස් පන්දාහක් මේ වැඩපිළිවෙළ තුළ ස්ථිර සේවකයන් බවට පත් වෙන බවත් මතක් කරන්නට ඕනෑ. ඒ නිසා ගමේ විසිරිලා තිබුණු ගමේ පීඩිත මිනිස්සු එකතු කරපු ප්‍රජා මූල සංවිධානය, සමෘද්ධි සමිතිය, සමෘද්ධි බැංකුව දිස්ත්‍රික් බැංකුවෙන් නතර වුණු තැනින් එහාට ජාතික මට්ටමේ වැඩපිළිවෙළකට මේ පනත තුළින් මේ රටේ තැලෙන, පොඩිවෙන මිනිස්සු එකතු වෙනවාය කියන එක තමුන්නාන්සේලාට මතක් කරලා දෙන්නට ඕනෑ. ඒ නිසාවෙන් ගරු සභාපතිතුමනි, ඉතාම සාර්ථක, විසිරී තිබුණා වූ විවිධ සහනාධාර ක්‍රමවේදයන් නිවැරදි මාවතට එකට එකතු කරලා, නිවැරදි වැඩපිළිවළක් තුළ හෙට දවස තුළ, මේ රටේ දුප්පතුන් ඇති හැකි අය වෙන්නට පුළුවන්. එහෙම නැත්නම් ස්වශක්තියෙන් නගා සිටුවීමේ මහඟු නිවැරදි වැඩපිළිවෙළක් හැටියටයි මේ දිවිනැගුම පනත අපි දකින්නේ. ඒ නිසා කිසිවෙකු මේකට භය වෙන්න ඕනෑ නැහැ. මේ සමෘද්ධි නිලධාරීන් විසි හතර දාහක් මේ වැඩපිළිවෙළ තුළ ඉන්නවා. සමෘද්ධි නිලධාරීන් ඉන්නවා. සමෘද්ධි කළමනාකරුවන් ඉන්නවා. අනෙකුත් උඩරට සංවර්ධන අධිකාරියේ, ඒ වාගේම දක්ෂිණ ලංකා සංවර්ධන අධිකාරියේ මේ සියලු දෙනා තිස්පන්දාහක් වෙනවා. අපි දන්නවා, අපේ රජය යටතේම විවිධ චෝදනා කළා. අපි ස්ථිර කරන්නේ නැද්ද? රාජ්‍ය සේවයේ හිමිකම් වරප්‍රසාද අපට නැදද? කියලා අපෙන් ඇහුවා. අපි අද භය නැතුව කියනවා, හෙට දවසේ මේ පනත සම්මත වීම තුළ තිස්පන්දහසක සේවකයින්ගේ සේවා සුරක්ෂිත භාවය, ස්ථිර භාවය ලැබෙනවා මහින්ද චින්තන වැඩපිළිවෙළ තුළ. ඒ වාගේම මතක් කරන්න ඕනෑ, රජයේ සේවකයින්ට. මේ රාජ්‍ය සේවාව තුළ තිබෙන අනෙකුත් පහසුකම්, විශේෂයෙන් ඉගෙන ගත්ත උපාධිධාරීන් රැසක් මේ තනතුරුවල ඉන්නවා. රාජ්‍ය පරිපාලන ව්‍යුහය තුළ උසස්වීම් ක්‍රමවේදයෙන් ඔවුන්ව ඉවත් වෙලා තිබුණේ. මොකද, ස්ථිර සේවයට පත් නොවීම නිසා. ඒ නිසා හෙට දවසේ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය තුළ උසස්වීම් ක්‍රමවේදයට අන්තර්ග්‍රහණය තුළින් ඔවුන්ට හිමිකම ලැබෙනවා.

ඒ වාගේම ජීවිත රක්ෂණ, අග්‍රහාර ක්‍රම, වැන්දඹු තත්ත්වයට පත් වුණාම ලැබෙන වන්දි ආදී සියල්ල මේ කටයුත්ත තුළ ඉෂ්ට සිද්ධ වෙනවාය කියන එක බොහොම ගෞරවයෙන් මේ වේලාවේ මතක් කරන්නට ඕනෑ. ඒ නිසා මම විශේෂයෙන් මීට වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මතක තියා ගන්නට ඕනෑ. විශේෂයෙන් මේ රටේ දීර්ඝ කාලයක් විවිධ විධියේ සහනාධාර ක්‍රමයන් තුළ විවිධ ආකාරයේ දුර්වලතාවයන් පැවතුණා. සමෘද්ධි අධිකාරිය තුළ වුවත් යම් යම් විවිධ චෝදනා අපට එල්ල කළා. සේවා ස්ථිරතාවයන් තුළ. බැංකුවල තිබුණු අඩුපාඩුකම්. මේ සියල්ල අද නිවැරදි කරමින් වඩාත් සැළසුම් සහගත ස්ථිරසාර හෙට දවසේ මේ රටේ දුගී දුප්පත් ජනතාව ස්වශක්තියෙන් නගා සිටුවීමේ නිවැරදි වැඩපිළිවෙළක් තුළයි මේ දිවිනැගුම පනත ගෙනැල්ලා, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවක් හැටියට අතිගරු ජනාධිපතිතුමා යටතේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ මග පෙන්වීම, ඉදිරිපත් කිරීම යටතේ සුරක්ෂිත වෙන වඩාත් සංවර්ධන වූ හෙට දවසක් දකින්නට ඔබට පුළුවන්කම ලැබේවි කියලා මතක් කරමින් සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සිරිකමල් පිලිමියන් ද සිල්වා**

ගරු සභාපතිතුමනි, ඔබා දෙනු පරහට, තමා සම්මතෙහි පිහිටා සිට.

**ගරු නිමල් ලාන්සා**

කොහෙන්ද ලියාගෙන ආවේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**

මගේ හිතවත් නියෝජ්‍ය සභාපතිතුමා, එතුමා බොහොම සාර්ථක කථාවක් කළා. හැබැයි, එතුමා මූලාසනයේ ඉන්න වෙලාවට තියෙන රළු දරදඬු ප්‍රතිපත්තිය එතුමා සම්පූර්ණයෙන්ම අමතක කරලා තමුන්නාන්සේව අමතන්නේ නැතුව, විටෙක නිමල් පීරිස් ගරු මන්ත්‍රීතුමනි, විටෙක වික්‍රම් ගුණසේකර ගරු මන්ත්‍රීතුමනි කියලා ජන සවිය කියන ඒ ශ්‍රේෂ්ඨ සංකල්පය නිරපරාදේ විනාශ කරමින් එතුමාගේ කථාව කර ගෙන ගියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

සභාපතිතුමනි, මට පොඩි වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙවා. ඒ වරප්‍රසාද ප්‍රශ්නය මට විතරක් අයිති දෙයක් නොවෙයි. ඒක ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා මන්ත්‍රීතුමාටත් අයිති දෙයක්. මොකද, මේ ගරු සභාවේ

**ගරු සිරිකමල් ද සිල්වා**

තමුන්නාන්සේ මූලාසනයේ සිටින විට කියනවා තමුන්නාන්සේව අමතන්න කියලා, අපි එහෙම කථා කරද්දි. මම ඒකයි කිව්වේ ඔබා දෙන පරහට , තමා සම්මතෙහි පිහිටා සිට කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**

මම කවදාක්වත් එහෙම අනවශ්‍ය දෙයක් මේ ගරු සභාවේ ඕලාරික වූ අසංවර දෙයක් ප්‍රකාශ කළේ නැහැ.

**ගරු සිරිකමල් ද සිල්වා**

ගරු සභාපතිතුමනි, මම ඊට වඩා ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත් එතුමා ගේ කථාවේදී කියපු අඩුපාඩු කිහිපයක්ම උපයෝගී කර ගෙන මම කථා කරන්න සූදානම්. එතුමා කිව්වා, විශේෂයෙන්ම ජන සවිය සම්බන්ධයෙන් ප්‍රදර්ශනය පවත්වන විට ගෙනාපු මයියොක්කා අල, අරව මේවා ගැන විශාල හැල්ලක් කිව්වා. නමුත් අපි කියන්න ඕනැ. මීට ටික දවසකට ඉස්සෙල්ලා මේ රටේ මහා ධනස්කන්ධයක් වියදම් කරලා, අනුරාධපුරයේ කරපු දැයට කිරුළ කියන ප්‍රදර්ශනය. ඒ හැම තැනම එහෙම තමයි. මේ එහා පැත්තේ තියෙන පාර්ලිමේන්තු ක්‍රීඩාංගණයේ අර ඇමතිතුමා කරපු මහා විනාශය විශාල නාස්තිය.

**ගරු නිමල් ලාන්සා**

මොකක්ද ? තේරුනේ නැහැ.

**ගරු සිරිකමල් ද සිල්වා**

දැයට කිරුළ තියද්දි රේල් පාරවල් හදලා, දුම්රිය ස්ථාන හදලා, මහා ලොකු ප්‍රදර්ශණයක් කරලා, ඒවා

ඔක්කෝම කිසිම හිරිකිතයක් නැතුව ආයේ ගලවා ගෙන ගියා. මේවා තමයි නස්තිය. අර මඤ්ඤොක්කා අල ගැන කථා කරන කොට ඒවා ගැනත් මතක තියා ගෙන කථා කළා නම් මම හිතන්නේ, මීට වඩා හුඟාක්ම යහපත් කියලා මා කල්පනා කරනවා.

අද දවසේ රටේ තියෙන ප්‍රධාන ආයතන තුනක්, දක්ෂිණ සංවර්ධන අධිකාරිය, උඩරට සංවර්ධන අධිකාරිය, සමෘද්ධි අධිකාරිය කියන මේ ආයතන තුන අහෝසි කරලා දැන් අපි මේ දිවිනැගුම දෙපාර්තමේන්තුව පිහිටුවීම මේ පනත ගැන පළාත් සභාවට කථා කරන්න දීලා තියෙනවා. මේක හොර පාරේ පාර්ලිමේන්තුවට යන්න ගියේ. නමුත් උසාවි නියෝගයක් අනුව, ගරු කථානායකතුමාට සිද්ධ වුණා, දිවිනැගුම පනත කලින් පළාත් සභාවලට යොමු කරන්න. එ නිසා තමයි මේ හදිසි රැස්වීමක් දාලා, අපේ න්‍යාය පත්‍රයේ නොතිබුණු, හදිසි රැස්වීමක් මේ පළාත් සභාවේ අද ඇති කරලා මේ පනත කඩිමුඩියේ සම්මත කරගන්න හදන්නේ. මේ වන කොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිතයෝ මේ ලංකාවේ ඉන්නවා. තව මාසයකින් එකහමාරකින් නොවැම්බර් මාසය වන කොට අපේ ජාතික අයවැය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා මේ කටයුතු පිළිබඳව සහතිකයක් දෙන්න සිදු වෙලා තියෙනවා අපේ රජයට. ඒ සහතිකය ගන්න අවශ්‍ය නිසා තමයි හදිසියේ මේ කටයුතු කරන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්න ඕනෑ ණය ටික අරගන්න නම් මේ තියෙන කොන්දේසිවලට අපි යටත් වෙන්න ඕනෑ. කැමැත්තෙන් හෝ අකමැත්තෙන්. ඒක නිසා තමයි, හදිස්සියේ මේ සියලු පළාත් සභා හරහා මේ පනත සම්මත කර ගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න හදන්නේ. නමුත් කරන්න ගිය එක නොවෙයි. මේ පළාත් සභාවෙන් විමසන්නේ නැතුව, බොහොම පැහැදිළිව පළාත් සභාවෙන් විමසන්නේ නැතුව මේ පනත සම්මත කර ගන්න ගියා. නමුත් ඒකට ඉඩක් ලැබුණේ නැහැ. අධිකරණය අද ස්වාධීනව තිබෙන නිසා.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම මේ පනත හරහා අපේ ගරු ශ්‍රීනාත් පෙරේරා නීතිඥ මන්ත්‍රීතුමා ඉතා පැහැදිළිව කිව්වා, පළාත් සභාවක් හැටියට අපි මොනතරම් හැල්ලු වෙනවාද කියලා. පළාත් සභාවේ තියෙන බලතල මොන විදියට කප්පාදු වෙනවාද කියලා. මේ සභාවේම අදහස් දක්වපු මන්ත්‍රීවරුන්ට, ඉතාමත් හොඳට හෘද සාක්ෂිය තියෙන මන්ත්‍රීවරුන්ට මම දැක්කා, මේ සභාව දිහා බලාගෙන ඉන්නකොට වෙනදාට හුඟාක් කෑ ගහන උපාලි කොඩිකාර ඇමතිතුමා මම හිතන්නේ කිසිම බාධාවක් කළේ නැහැ. එතුමාගේ හෘද සාක්ෂියත් කියනවා ඇති මේක ඇත්ත වශයෙන්ම අසාධාරණ වැඩක් කියලා. ඒ වාගේම තමයි මේ ඉදිරි පෙළ ඉන්න සමහර හෘද සාක්ෂියක් තියෙන ගරු මන්ත්‍රීවරු. සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාලා වාගේ අය. මම හිතන්නේ බාධාවක් කළේ නැතුව අහගෙන හිටියා. ඒ අහගෙන හිටියේ. තමන්ගේ හෘද සාක්ෂිය කියනවා. ඇත්ත වශයෙන්ම කිසිම අවස්ථාවක සමෘද්ධි නිලධාරීන්ව රාජ්‍ය සේවයේ යම් කිසි ස්ථාවරයකට පත් කිරීම පිළිබඳව අපේ විරුද්ධතාවයක් නැහැ. නමුත් සමෘද්ධිලාභීන් වන මේ රටේ දුගී දුප්පත් ජනතාවට මේ කරන්න යන හානිය කෝටි ප්‍රකෝටි ගණනක් මේ සමෘද්ධි අධිකාරියේ තියෙන සල්ලි අද තමනගේ හිතුමනාපයට පුද්ගලයන් කිහිප දෙනෙක් ලවා වියදම් කරලා ආණ්ඩුවේ තියෙන නොහැකියාව වසා ගන්න මේ මුදල පාවි- චි කිරීම පිළිබඳවයි අපේ තියෙන විරෝධතාවය. මම අමනාපයෙන් කිව්වේ නැහැ. මම

රංජිත් සෝමවංශ මැතිතුමාට පොඩි විහිළුවක් තමයි කළේ. එතුමාගේ හිත රිදීමක් වුණා නම් ඒ ගැනත් සමාව ඉල්ලමින් නිහඬ වෙනවා

**ගරු කීර්ති උඩවත්ත**

ගරු සභාපතිතුමනි, දිවිනැගුම පනත සම්බන්ධයෙන් අද පැවැත්වෙන විවාදයට සම්බන්ධවීමට ලැබීම ගැන මා පළමුවෙන්ම මාගේ සතුට ප්‍රකාශ කරන්න කැමතියි. අපේ උගත් සිරිකමල් මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළා, මේ පනත හොර පාරෙන් පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න ගියාය කියලා. මා සමග එකඟ වෙනවා ඇති අපේ උගත් ජනාධිපති ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා. පාර්ලිමේන්තුවට යම් පනතක් ඉදිරිපත් කළ විට නියමිත කාලවකවානුවක් තුළ, ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකුට ඊට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට යා හැකියි. ඒ අවස්ථාව ප්‍රයෝජනයට ගෙන තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වගන්තිය උපයෝගී කරගනිමින් මේ පනත සම්බන්ධයෙන් පළාත් සභාවේ අදහස් විමසීමට යෝජනා කරලා තියෙන්නේ. අද උදෑසන මහ කාලගෝට්ටියක් නිර්මාණය කළ අපේ අනෙක් ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එම වගන්තිය කියවා තිබුණා නම් මා හිතන්නේ අපට මේ ප්‍රශ්නය බොහොම සරලව නිරාකරණය කර ගන්න තිබුණා.

ගරු සභාපතිතුමනි, මේ දිවිනැගුම පනතේ පරමාර්ථය කුමක්ද? ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටක අද දවසේ මූලික ප්‍රශ්නය මා දකින්නේ, දිළිඳු භාවය පිළිබඳ ප්‍රශ්නයයි. මේ දිළිඳු භාවය පිළිබඳ ප්‍රශ්නය අපේ න්‍යාය පත්‍රයේ අංක එකට ඉන්නේ. අපි ඊට වඩා ඉහළින් තිබුණු ඉතාම බරපතල ප්‍රශ්නයක් මේ වන විට නිරාකරණය කර ගෙන තිබෙන නිසයි. රටක ආර්ථික සංවර්ධන විෂයෙහි ලා ඉතාම වැදගත් වන රටේ සාමය සහ ආරක්ෂාව මේ වනවිට ස්ථාපිත වී තිබෙනවා. අන්න ඒ පදනම තුළ සිට තමයි, අපි දිළිඳු භාවය පිටු දැකීමේ යෝධ පිම්මක් පැනීමට සූදානම් වන්නේ. ඒ සඳහා පවතින නීති රීති බාධාවක් නම්, එයින් පළාත් සභාවේ බලය හැකිලෙනවාය කියා අපි ආර්මාර්ථකාමීව ඊට විරෝධය දැක්වීම යථාර්ථය නොවන බවයි මා විශ්වාස කරන්නේ.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට මේ අවස්ථාවේ සඳහන් කරනනට ඕනෑ, මේ 13 වැනි ව්‍යවස්ථාව නිසා අනාගතයේදී අපට බරපතල ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිද්ධ වෙන්න ඉඩ තියෙනවා. මේ 13 වැනි ව්‍යවස්ථාව නිසා පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට තිබෙන අණපනතක් ශ්‍රේෂ්ඨාධිකරණය හරහා පළාත් සභාවට යොමු කරන්න පුළුවන්. පළාත් සභාව තුළ බලය විපක්ෂය සතු වී තිබෙනවා නම් ඔවුන් තමන්ගේ පටු න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා එවැනි පනත් පරාජය කිරීමේ හැකියාව ඔවුන්ට තිබෙනවා. එහෙම වුණොත් රටක් හැටියට මධ්‍යම ආණ්ඩුවට අනාගතයේදී බරපතල ප්‍රශ්න ඇති වෙනවා, මෙ නීතිමය සංශෝධනය නිසා.

**ගරු ශ්‍රීනාත් ම පෙරේරා**

අපට පනතක් පරද්දන්න බැහැ මන්ත්‍රීතුමා.

**ගරු නිමල් ලාන්සා**

ඔබතුමා කට වහගෙන ඉන්නකෝ. එතුමාගේ කථා කරන්නේ. ඔබතුමගේ අවස්ථාවේ කථා කරන්න ඔබතුමා. ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටියා නම් ඔහොම කියන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**

බාධා කිරීම් කරන්න එපා එතුමාට.

**ගරු කීර්ති උඩවත්ත**

ඒ නිසා ඉදිරි අනාගතයේදී මේ 13 ව්‍යවස්ථාව සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුවට පැහැදිළි තීන්දුවක් ගන්න වෙයි කියන එකයි මා විශ්වාස කරන්නේ. දැන් අපි හැරෙමු දිළිඳුකම පිටු දැකීමේ මේ පනත දිහාවට. මේ පනත ගැන විපක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කළේ මහා විනාශයක් සිද්ධ කරන්න සූදානම් වන ආකාරයටයි. ඇත්තෙන්ම මම මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා. දිවංගත ආර් ප්‍රේමදාස මැතිතුමාව. එතුමා තමයි මේ රටේ පළවැනි වරට දිළිඳුකම පිටුදැකීම සඳහා යම්කිසි සංවිධානාත්මක වැඩපිළිවෙළක් යෝජනා කළේ. අනෙක් අය හාල් දෙනවා. ඇට දෙනවා. අරවා දෙනවා, මේව දෙනවා කියලා යම් අවිධිමත් දේශපාලන පොරොන්දු දුන්නා මිසක් එවැනි විධිමත් වැඩපිළවෙළකට ගියේ නැහැ. මොනතරම් අඩුපාඩු තිබුණත්, මොන තරම් විවේචන තිබුණත් ඒ සම්බන්ධයෙන් පැහැදිළි ජාතික ප්‍රතිපත්තියක් ආරම්භ කිරීමේ ගෞරවය ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාට හිමි වෙනවයි කියන එක අපි බොහොම ගෞරවයෙන් සඳහන් කරන්න කැමතයි. මෙන්න මේ වැඩපිළවෙළේ අඩුපාඩු හදලා, මේ වැඩපිළිවෙළ ජාතික මට්ටමින් තවත් ශක්තිමත් කිරීම සඳහා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව විසින් සමෘද්ධි ව්‍යාපාරය මේ රටට ඉදිරිපත් කරනු ලැබුවා. මේ ව්‍යාපාරය තුළ යම් යම් අඩුපාඩු මුල සිටම අපි දැක්කා. විශේෂයෙන්ම විශාල මුදලක් මේ හරහා අපේ රටේ ඉතුරු කිරීම් වශයෙන් ඇති වෙලා තිබෙනවා. මේ වෙලාවේ ආර්ථික විද්‍යාත්මක සිද්ධාන්ත ගැන කථා කරනවා නම් අපේ රටේ මේ ආර්ථික තත්ත්වය රැග්නා නර්ස් කියන ආර්ථික විද්‍යාඥයා විග්‍රහ කරලා තියෙන දරිද්‍රතාවයේ විෂය කවයට සම්බන්ධ කරන්න පුළුවන්. මේ රටේ ඉතිරි කිරීම් ඉතාම අඩුවෙන් තිබුණේ. ඒ නිසා ඒ අඩු ඉතිරි කිරීම් යටතේ රටේ ආයෝජන අඩුවෙන් සිද්ධ වුණේ. අඩු ආයෝජනය නිසා රටේ ආර්ථික වර්ධනය ඉතාම අඩුවෙන් සිද්ධ වුනේ, ඒ නිසා සංවර්ධන ඉලක්ක කරා අපට යන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත් මේ සමෘද්ධි ව්‍යාපාරය හරහා අපේ පාදුක්ක මන්ත්‍රීතුමා කිව්වා වාගේ බිලියන 52 ක අතිවිශාල මූල්‍ය සම්භාරයක් මේ රටේ අහිංසක දුප්පත් මිනිස්සු ඉතිරි කරලා තියෙනවා. ඒ ඉතිරි කිරීමේ ගෞරවය එදා ආණ්ඩුව විසින් ආරම්භ කරපු සමෘද්ධි ව්‍යාපාරයට හිමි වෙනවාය කියන එක අපි මේ වෙලාවේ මතක් කරන්නට ඕනෑ. ඒ දුප්පත් මිනිස්සු ඉතිරි කිරීමේ ක්‍රියාදාමයට යොමු කළේ, මේ සමෘද්ධි ව්‍යාපාරය තුළින්. මහජනතාවගේ මේ මුදල් සංවිධානාත්මක ලෙස, විධිමත් ලෙස මධ්‍යම රජයේ පාලනයට හසු කරලා ඒවා ඔවුන්ගේ දියුණුව සඳහා යොමු කිරීමේ පළමුවැනි වැදගත්ම පියවර මේ දිවිනැගුම පනතයි කියන එක මේ වෙලාවේ අපි බොහොම පැහැදිළිව සඳහන් කරන්න කැමතියි. මේ පිළිබඳව මම එක කාරණාවක් කියන්න ඕනෑ. අපේ උගත් නීතිඥතුමා විවිධ අවස්ථාවලදී බාධා කරන නිසා. සභාපතිතුමනි, ගංගොඩවිල උසාවියට නඩුවක් එනවා, සමෘද්ධි මුදල්

සොරකම් කිරීම සම්බන්ධයෙන්, කළමනාකරුවෙකුට විරුද්ධව. අඩු තරමින් මේ නඩුව පොදු දේපළ පනත යටතේවත් ඉදිරිපත් කරන්න පුළුවන් නෛතික තත්ත්වයක් තිබුණේ නැහැ. නමුත් මේ නව පනත තුළ සමුපකාර ව්‍යාපාරයේ යම් යම් උසස් ගුණාංග මෙ පනතට ග්‍රහණය කර ගනමින්, ඒ නෛතික රාමුවට මේ පනත තුළින් පන දෙමින් නීතිමය තත්ත්වයක් ඒ මුදල් අයථා ලෙස පරිහරණය කරන්නෙකුට දඬුවම් කිරීමේ හැකියාව මේ පනත තුළින් ලබා දීල තියෙනවයි කියන එක බොහොම වගකීමෙන් යුතුව මේ වෙලාවේ සඳහන් කරන්න කැමතියි. ඒ නිසා කවුරුහරි කියනවා නම් මේ සමෘද්ධි මුදල් ටික මංකොල්ල කන්න ආණ්ඩුවේ ප්‍රචාරක වැඩවලට යොදා ගන්න මේ මුදල් ආණ්ඩුව අත්පත් කර ගන්නැයි මේ පනත ගෙනාවේ කියලා ඒක හුදු දේශපාලන සටන් පාඨයක් පමණක් කියන එක මේ වේලාවේ ගරු සභාපතිතුමනි, මම සඳහන් කරන්න කැමතියි.

1960 දශකයේ මේ රටට එනවා ඩඩ්ලි සියර්ස් කියලා ආර්ථික විද්‍යාඥයෙක්. සමහර විට ඔබතුමාලා කියන්න පුළුවන් 1960 කියන්නේ මේ දශක ගණනකට එහා කියලා. නමුත් සත්‍ය අවුරුදු තිහකට, හතළිහකට පෙර කිව්වත්,

## සම්බන්ධය නිවැරදියි

ඒක සත්‍යයම තමයි. එතුමා මේ රටට ගෙන්වන්නේ ඩඩ්ලි සේනානායක අගමැතිතුමා. එතුමා ඩඩ්ලි සියර්ස් ට ආරාධනා කරනවා මේ රටේ ආර්ථිකය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. එතුමා ආර්ථික සංවර්ධනය සම්බනධයෙන් මේ රටට ඕනෑ කරන ප්‍රධාන නිර්ණායකයන් හතරක් හඳුනා ගන්නවා. එකක් තමයි, ආර්ථික සංවර්ධනය තුළ ශ්‍රී ලංකාවේ විරැකියාව අඩු විය යුතුයි. ශ්‍රී ලංකාවේ දිළිඳු භාවය අඩු විය යුතුයි. ශ්‍රී ලංකාවේ ආර්ථක ආදායම් විෂමතාවය අඩු විය යුතුයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය විය යුතුයි කියන එක. මේ කාරණා සියල්ලම අදටත් වලංගුයි. මේ දිළිඳු භාවය අඩු කිරීමට, ඒ වාගේම ආර්ථික ආදායම් විෂමතාවය අඩු කිරීමට, මෙ දිවි නැගුම ව්‍යෘපෘතිය මම හිතන්නේ මේ රටේ දුප්පත් මිනිසුන්ට විශාල ශක්තියක් වනවා ඇති. අද අපි උදේ දැක්කා, සමෘද්ධි සේවකයන්, නිලධාරි මහත්වරු විශාල පිරිසක් මෙ ස්ථානයට ඇවිල්ලා උද්ඝෝෂණය කරනවා.

ගරු සභාපතිතුමනි, මීට අවුරුද්දකට විතර පෙර මේ රටේ විශ්‍රාම වැටුප ලබා දීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශය දැවැන්ත විරෝධතාවයක් සංවිධාන කළා. ඇත්තෙන්ම මම ඒ ගැන කනගාටු වෙනවා. පෞද්ගලික අංශයේ සේවකයන්ට ස්ථිර විශ්‍රාම වැටුපක් ලබා දීම ඔවුන්ගේ වෘත්තීය ජීවිතයේ විශාල ජයග්‍රහනයක්. නමුත් ඒ තුළට රිංගු ජනතා විමුක්ති පෙරමුණ, පටු දේශපාලන වාසි ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ක්‍රියා කළ වෘත්තීය සමිති ඒ අහිංසක පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දෙන්න තිබුණු වරප්‍රසාද අයින් කරලා අවසානයේ ජීවිතයකුත් බිල්ලට දීලා ඒ උදාර වැඩපිළිවෙළ විනාශ කරන්න සමත් වුණා. අපි ස්තුතිවන්ත වනවා අපේ මන්ත්‍රීතුමාට. ජගත් කුමාර මන්ත්‍රීතුමා දායකත්වය දරන සමෘද්ධි නිලධාරීන්ගේ සංගමයට පුළුවන් වුණා,ී මේ වෙලාවේ මේ උදාර වැඩපිළිවෙළ විනාශ වෙන්න නොදී ජනතා විමුක්ති පෙරමුණේ කුමන්ත්‍රණයෙන් බේර ගන්න. ඒ සේවක සහෝදරවරුන් බේරාගන්න නිර්භයව පාරට බැහැලා ක්‍රියා කිරීම ගැන අපි ඔවුන්ට ස්තුතිවන්ත

වෙන්න ඕනෑ. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කාලවේලාව අවසන් වන නිසා. ජාත්‍යන්තර වශයෙන් බංගලි දේශය ග්‍රාමීය වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරලා තමන්ගේ ග්‍රාමීය දිළිඳු භාවය අඩු කිරීම සඳහා ක්‍රියා කරනවා වාගේ, ඉන්දියාව, පංචායත් ක්‍රමය මගින් තමන්ගේ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳු භාවය පිටු දැකීම සඳහා ක්‍රියාත්මක වනවා වාගේ, ශ්‍රී ලංකාව තුළ මේ දිවි නැගුම ව්‍යාපෘතිය තුළින් බැසිල් රජපක්ෂ මහතා - අපි ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා ගැන කථා කළා වාගේ ඉතිහාසයේ යම් දවසක මේ රටේ නිර්ධන පංතිය, වැඩ කරන පංතිය දිළිඳු මිනිසුන් තුළ ඉතාම වැදගත් චරිතයක් බවට පත් වනවාය කියන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු එස්. රාජේන්ද්‍රන්**

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමට ස්තුතිවන්ත වෙනවා. දිවිනැගුම පනත අද මේ සභාවට ගෙනැල්ලා සෑම මන්ත්‍රීවරයෙක්ම විවාද කළා. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණේ පක්ෂය හැටියටත්, සුළු ජාතිය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියටත්, මෙම දිවි නැගුම පනත අපි දන්නවා පාර්ලිමේන්තුවට ගිහින් නැවත උසාවි ප්‍රශ්නයක් කර ගෙන නැවතත් පළාත් සභාවේ සාකච්ඡා කිරීමට ලැබිලා තියෙන බව. එතකොට අපට තේරෙනවා මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තුවෙන්ම විසඳා ගන්නට කටයුතු යොදලා තියෙන අවස්ථාවේ නැවත වරක් උසාවි ගිහින් අපට මේ ගැන සාක- ඡා කිරීමට ලැබිලා තියෙන බව. අන්න එතැනින්ම පේනවා ප්‍රජාතන්ත්‍රවාදය නැතිවී ගොස් ඇති බව. ඒ කියන්නේ, අද අපි දන්නවා උතුර මැද පළාත් සභා ඡන්දයෙන් හිටපු මහ ඇමතිවරයාට මොකක්ද වෙලා තියෙන්නේ කියලා. මීට පෙර මේ පළාත් සභාවේ තියෙන අයිතිය, ඉඩම්වල අයිතිය සම්බන්ධව පනතක් ගෙනාවා. එයත් පාර්ලිමේන්තුවට ගිහින් නැවත වතාවක් උසාවි ගිහින් තමයි මේ වාගේම සාකච්ඡාවට ආවේ. කෙසේ වෙතත් අපි බස්නාහිර පළාත් සභාව ආණ්ඩු පකෂයේ වැඩි බලතල තියෙන නිසා එය ලෙහෙසියනේ සම්මත කර ගත්තා. ඒ වාගේම උතුරුමැද පළාතේ ඇත්ත වශයෙන් අපේ ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කිව්වා විධියට කොන්ද කෙලින් තියා ගෙන කථා කරපු ඒ පළාත් සභාවේ බර්ටි ප්‍රේමලාල් මැතිතුමාට මොකක්ද වෙලා තියෙන්නේ කියලා මුළු ලංකාවම දන්නවා. ඒ කියන්නේ කෙලින් කොන්දක් ඇති අය හැටියට ඒ අය ඒ පනත නිශ්ප්‍රභා කළා. ඒ වාගේම නැගෙනහිර පිල්ලෙයාන් අද සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙලා ඉන්නවා. එතුමා මහඇමතිවරයා වශයෙන් ඉන්න කොටත්, ඒ පනතේ යම් යම් සංශෝධන ගෙනැල්ලා තමයි සභා වාර කිහිපයකට පස්සේ අනුමත කර ගත්තේය. එහෙම තියෙද්දි මේ වාගේ පනතක් හදිසියේ කඩිමුඩියේ ගෙනාපු එක ගැන අපේ පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන් විවාද කළා.

ඇත්ත වශයෙන්ම මෙම පනතෙහි දැන් කියනවා, සමෘද්ධි නියාමයකින්, රජයේ නිලධාරීන් හැටියට පත් වෙනවා කියලා. අප නොබෝදා බැලුවා කැළනිය ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් සමෘද්ධි නිලධාරියෙක්ව ගස් බැන්දා . ඊට පස්සේ එතුමා කිව්වා මම ගස් බැඳගත්තයි කියලා. ඒ වාගේම මේ ළඟදි ඒ මන්ත්‍රීවරයාගෙ පුතා මේජර්වරයාට ගහලා අමාරුවේ දාලා දැන් මේජර්වරයාට ගැහුවේ නැහැයි කියලා කියනවා. ඒකයි තත්ත්වය. ප්‍රජාතන්තවාදය කොහේද තියෙන්නේ කියන එක තමයි අද ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. මේ රටේ

ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයක් තියෙනවා නම් උසාවි ගිහිල්ලා එන්න ඕනෑ නැහැ මේ පනත. මේ පනත මෙතැනින්ම ගේන්න තිබුණා. මේ බස්නාහිර පළාත් සභාව පිහිට වුයේ ඇත්ත වශයෙන්ම උතුරු නැගෙනහිර ප්‍රශ්නය විසඳන්නයි. නමුත් අද මුලු පළාතෙන්ම ප්‍රශ්නයක් කර ගෙන තියෙන්නේ. මේක සුළු ජාතීන්ගේ විසඳුමකට ගෙනා ආපු මේ පළාත් සභාවල තියෙන බලතල මේ පළාත් සභාවට තියෙන බලතල මහ ආණ්ඩුව උදුරා ගෙන යනවා. ඉන්දියාවෙන් එන කොට මේ රටෙන් කිව්වා 13 Plus යනවා කියලා. ඊට වඩා යනවයි කියලා කිව්වා. නමුත් අද තියෙන තත්ත්වය දෙයියන්ගේ පිහිටයි. අන්න ඒකයි දහතුනත් නැතුව දහතුනේ තියෙන කැලි තව හොයලා හොයලා ගහලා ගන්නවා. අන්න ඒකයි අද තියෙන තත්ත්වය. එම නිසා ගරු සභාපතිතුමනි, සුලු ජාතියක් හැටියට අපි දන්නවා මේකට අනිවාර්යයෙන්ම විරුද්ධ වෙන අතර, සුලු ජාතීන්ට මෙයින් කිසිම වාසියක් වෙලා නැහැ. ඔබතුමාලා කියනවා. සමෘද්ධි නිලධාරීන්, සමෘද්ධිය ගන්න අය අද පාරේ ඉඳගෙන උද්ඝෝෂණය කරනවා. ඇයි බය වෙලා ඉන්නේ? ඔයගොල්ලන්ගේ වැඩි බලතලයක් මේ සභාවේ තියෙන කොට ඇයි බය වෙලා ඉන්නේ?

**ගරු උපාලි කොඩිකාර**

ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය.

**ගරු එස්. රාජේන්ද්‍රන්**

ඔබතුමා ඉවසගෙන ඉන්න. ඒ නිසා බය වෙන්න අවශ්‍යතාවයක් නැහැ. නමුත් මේක ප්‍රජාතාන්ත්‍රවාදි රටක් ද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. ඒ වාගේම මේ පනතේ දැන් එතුමන්ලා කියනවා නිලධාරීන් පත්කරන කොට මේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඒ පස් දෙනා ඇතුළත් වෙනවා. එතකොට ඒ අධ්‍යක්ෂවරයාගේ යටතේ තමයි පත් වෙන්නේ. ඒ අධ්‍යක්ෂවරයා කවුද පත් කරන්නේ කියලත් අපට ගැටළුවක් ඇති වෙලා තියෙනවා. ඒ වාගේම ඒකට වුවමනා විධියට මෙතැන කථා වෙන කොට කිව්වා ගරු සභාපතිතුමනි, සමෘද්ධි බැංකුවේ මුදල් කොල්ල කාලා උසාවියට යනවයි කියලා. අපි කියනවා පිලියන්දල මහජන බැංකුවේ කොපමණ සල්ලි මංකොල්ල කාලා ඒ නිලධාරීන් කටයුතු කරනවාද? ඒවා කෝ? ඒවා ගැන කිසිම කෙනෙක් කථා කරන්නේ නැහැ. ඒ නිසා සුළු ජාතික පක්ෂයක් හැටියට පොඩි මිනිසුන්ගේ සල්ලි ටික මංකොල්ල කන්න එපා කියමින් මා නිහඬ වෙනවා.

**ගරු ජෝර්ජ් පෙරේරා – වි.ප්‍ර.සං.**

ගරු සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධව මා සතුටු වෙනවා. ඇත්තටම මමත් පළාත් සභා ඉතිහාසයේ මේ තුන්වැනි පළාත් සභාවේ ඉන්නේ. ඒත් ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අද බලු කුක්කෝ වාගේ ඉන්නවා. ඒ ඇයි? අර බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මේ පනත නිසා. අද බලු කුක්කෝ වාගේ ඇවිල්ලා ඉන්නවා.

**සභාවෙන්:**

මහර බලු කුක්කා වුණේ කවුද?

**ගරු ශූ. ජෝර්ජ් පෙරේරා**

අද අපි පළාත් සභා ඉතිහාසයේ මීට වඩා මේ මහාමාත්‍යතුමා හොඳ පනත් ගෙනාවා. අයවැය විවාද ගියා. කවදාක්වත් මේ අමාත්‍යවරු මෙහෙම හිටියේ නැහැ. කවදාක්වත් බිම හිටියේ නැහැ. ඇයි? අර ජනාධිපති ලේකම් කාර්යාලය උඩ ඉන්නවා. ඒත් ලැජ්ජයි කියන්න ගරු සභාපතිතුමනි. වෙනදාට විනාඩි පහෙන් එන ඇමතිවරු. අද ඉන්නවා. මේක තමයි ඇත්ත දේ. ඒ පවුල් බලය රැක ගන්න. ඒත් මම කියන්න ඕනෑ. කොන්ද ඇති මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා මේකේ. ගම්මන්පිල ඇමතිතුමා. රන්දීර් මන්ත්‍රීතුමා. තුෂාර පෙරේරා මැතිතුමා අද ඇවිල්ලා නැහැ. අද ඇතවත් ඉන්නවාද කියලා ශ්‍රීනාත් මන්ත්‍රීතුමාගේ උත්තරයෙන් හම්බ වෙයි. මෙවැනි තත්ත්වයක් තියෙන්නේ. ගරු සභාපතිතුමනි,

**ගරු උපාලි කොඩිකාර**

**ගරු සභාපතිතුමනි,**

ඔබතුමාට ................ ඉන්නේ. එම නිසා වැරදි මතයක් මේ මාධ්‍යයට දීම වරදක්. (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**

මේ ජගත් කුමාර මන්ත්‍රීතුමා මේ කරන නාඩගම. තවත් නාඩගමක් මේ කථාවෙන් පස්සේ ඉවරයි. උදේත් කළා ඒ නාඩගම. හැබැයි, එදා තමුන්නාන්සේ දැක්කා නම් රාජේන්ද්‍ර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගස් බැඳලා ගස් බැන්දේ නැහැයි කියනවා. අර මේජර් කිව්වා ගැහැව්වා මම ගුටි කෑවේ නැහැයි කියනවා. හෙට අනිද්දා කියයි භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මැරුවේ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර කියයි. නැහැ එයාම මරා ගත්තා. එයාම වෙඩි තියාගත්ත කියයි. ඊට පස්සේ ජගත් කුමාර කියයි, සමෘද්ධියට මෙහෙම දෙයක් වුණාද? මෙහෙම කැපුනද? අනේ අපි දන්නේ නැහැ. මෙහෙම තමයි වෙන්නේ. මේක තමයි ඇත්ත. මේක තමයි යථාර්ථය. ඉතින් මෙවැනි තත්ත්වයක් උඩ (බාධා කිරීම්) මේ දිවි නැගුම ක්‍රියාත්මක කිරීම තුළින් සමෘද්ධි සහනාධාරය කැපෙනවා. සමෘද්ධි නිලධාරීන් ඉවත් කෙරෙනවා. ඒ වාගේ දේවල් මින් ඉදිරියට වෙනවා. එම නිසා මේ පනත සම්බන්ධව අපේ විරෝධය ප්‍රකාශ කරනවා වාගේම ගරු සභාපතිතුමනි, (බාධා කිරීම්) මේක තමයි ඇත්ත දේ. මේක තමයි ඇත්තටම වෙන්නේ. අද මේ පනත අකුලා ගත්තේ නැත්නම් වෙන දේ. සමෘද්ධි කැපෙනවා. මම සභාගත කරනවා බැනර් එක සමෘද්ධිය කැපෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා මූලාසනයට පෙන්වන්න.

[සභාවේ ඝෝෂා]

**සභාවෙන්:**

ඔය මාධ්‍යවලට කහින්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, අද මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවකට බලපාන ඒ වාගේම රාජ්‍ය සේවය ලැබීමට නියමිත දහස් සංඛ්‍යාත නිලධාරීන් සංඛ්‍යාවකට බලපාන ඒ වාගේම මේ රටේ පවුල් වශයෙන් ගත්තාම විශාල ප්‍රමාණයකට දැනෙන පනතක් සම්බන්ධව සාකච්ඡා කරන්න අධිකරණය හරහා මේ සභාවට අවස්ථාව ලැබීම පිලිබඳව මම ඉතාම සතුටට පත් වෙනවා. මොකද, මේ පනත් කෙටුම්පත මේ රටේ ජනතාවට පුන පුනා ඉල්ලා හිටපු පනතක්. ඒ වාග්ම මේ පනත මේ රටේ සමෘද්ධි ව්‍යාපාරයට සම්බන්ධව සේවය කරන නිලධාරීන් දහස් ගණනක් දිගින් දිගට වසර ගණනාවක් තිස්සේ ඉල්ලපු පනතක් කියන කාරණාව සභපතිතුමනි, අපි පැහැදිලි කරන්න ඕනෑ. මෙතැන විවිධ මතවාද, ඒ වාගේම විවිධ චෝදනා, විවධ අදහස් ඉදිරිපත් වුණා. හැබැයි මේ පනත් කෙටුම්පත සැබැවින්ම නිවැරදි ආකාරයෙන් අධ්‍යයනය කළා නම් මම විශ්වාස කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

නැහැ. නැහැ. මගෙ ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කථා කරන්න. මම ඇහැරිලා ඉන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

ගරු සභාපතිතුමනි, ඔබතුමාට අපහාස කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**

සභාපතිතුමාගේ ගෞරවය හැල්ලුවට ලක් වෙනවා. ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න. සභාපතිතුමා නිදි කියලා කිව්වා.

[සභාවේ ඝෝෂා] **- පටිය අහන්න**

**ගරු සභාපතිතුමා.**

සභාව නිශ්ශබ්ද වෙන්න. මම ඉතාමත්ම කනගාටු වෙනවා ගරු මන්ත්‍රීතුමා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමා වැරදි ප්‍රකාශයක් කළේ. කරුණාකරලා ඉල්ලා අස්කර ගන්න ඒ ප්‍රකාශය. ඔබතුමාට එහෙම ප්‍රකාශ කරන්න අයිතියක් නැහැ, ඒ විධියට. මූලාසනයට ගරු කරන්න ඕනෑ ඔබතුමා.

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, ඒ අදහස මම ඉවත් කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා මූලාසනයෙන් සමාව ගන්න ඕනෑ කරපු ප්‍රකාශය. ඔබතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉතා වැරදි ප්‍රකාශයක් කළේ.

**ගරු ජගත් කුමාර**

මූලාසනයට මම ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරනවා. ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

මම නිදාගත්තේ නැහැ. ඇහැරිලා ඉන්නේ.

**ගරු ජගත් කුමාර**

මම දැන් කිව්වා මූලාසනයට ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරනවා කියලා.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා ගෞරව කරන්න ඕනෑ මේ සභාවට. ඔබතුමාට අයිතියක් නැහැ එහෙම කියන්න.

**ගරු ජගත් කුමාර**

දැන් තුන් සැරයක් කිව්වා. ඒ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරනවයි කියලා.

[සභාවේ ඝෝෂා]

**සභාවෙන්:**

කිව්වා. කිව්වා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

දැන් ඒ ප්‍රශ්නය ඉවරයි. ඔබතුමාලා වාඩි වෙන්න. කරුණාකරලා මන්ත්‍රීතුමාලා වාඩි වෙන්න. ඒ ප්‍රශ්නය හරි. ඒක මගේ ප්‍රශ්නයක් තියෙන්නේ එතුමත් එක්ක.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**

ඒක පුද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. සභාවට අපහාස කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

සභාපති නිදියි කිව්වා.

**ගරු ජෝර්ජ් පෙරේරා**

සභාපති නිදියි කියන්නේ බස්නාහිර පළාත නිදිද කියලාද කියන්නේ.?

**ගරු සභාපතිතුමා**

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**

එතුමා වැරදි පුටුවේ ඉන්නේ.

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. මම අවසර දුන්නා එතුමාට.

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මම ඉතාමත්ම ගෞරවයෙන් කාරුණිකව හැම මන්ත්‍රීවරයෙකුගෙන්ම ඉල්ලා සිටිනවාජ් ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මූලාසනයට ගරු කරන්න හැම මන්ත්‍රීවරයෙක්ම. සභා රීති උල්ලංඝනය කරන්න එපා. ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය මට ඇහුනා. ඒ නිසා ඔබතුමා එය ඉල්ලා අස්කර ගන්න.

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, මම දැන් තුන් සැරයක්ම කිව්වා ඒ ප්‍රකාශය සම්බන්ධව මගේ කනගාටුව ප්‍රකාශ කරනවයි කියලා. මේ මයික් වැඩ කළේ නැහැ. ඒ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට තව විනාඩි පහක කාලයක් දෙනවා. කාලය දික් කරන්නේ නැහැ.

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, සභාව දිගින් දිගටම පාලනය වුණේ නැහැ. සභාපතිතුමනි, මම මේ කාරණය සම්බන්ධයෙන් ඒක ඉල්ලා අස්කර ගත්තා විතරක් නොවෙයි. මට අවස්ථාව දෙන්න කියලා දිගින් දිගටම ඉල්ලනවා. මොකද, මේ සම්බන්ධව උදේ ඉඳන් විවේචන රාශියක් තිබුණේ මගේ පැත්තට යොමු වෙමින්. ඒ වාගේම මෙන්න මේ කාරණාවලදී මම යම්කිසි අදහසක් ප්‍රකාශ කළා නම් ඒ අදහස ප්‍රකාශ කළේ සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**

මේ සභාවේ අනවශ්‍ය ඝෝෂා කිරීම් කරන්න එපා. . තව විනාඩි පහයි තියෙන්නේ.

**ගරු ශ්‍රිනාත් පෙරේරා.**

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්

**ගරු සභාපතිතුමා**

වරප්‍රසාද ප්‍රශ්නය ඔබතුමා කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

මෙතුමා කථා කරනනේ වැරදි පුටුවේ ඉඳන්.

(පටිය අහන්න)

**ගරු සභාපතිතුමා**

මම එතුමාට අවසර දුන්නා. එතුමාගේ ආසනයේ සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු සභාපතිතුමා**

අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කරුණාකර නිශ්ශබ්ද වෙන්න. සභාව යන්න බැහැ මේ විධියට.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, මම ඔබතමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලනවා. මේ සභාවේ ඔබතුමා දිගින් දිගටම මට අවස්ථාව - මේ මන්ත්‍රීතුමා මට අභියෝග කළා, මේ පනතේ සමෘද්ධි නිලධාරීන් සම්බන්ධව කාරණාවක් තියෙනවා නම් ඒ අභියෝගය භාර ගන්නවා කියලා. ඒ මන්ත්‍රීතුමා අභියෝග කළා මට සමෘද්ධි සේවකයන්ගේ අයිතිවාසිකම් මේ පනතින් රැකෙන්නේ නැහැයි කියලා. දැන් ඒ අභියෝගය මම භාර අරන් කථා කරයි කියන බයට මට, අදහස් ප්‍රකාශ කරන්න දෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පනත තුළ ඉතා පැහැදිලිව මේ කරුණු ඇතුළත් වෙලා තියෙනවයි කියල අපි පැහැදිළිව කියනවා. මේ පනතේ 29 වැනි පිටුවේ, ඒ වාගේම පළමුවැනි ඡේදයේ තියෙනවා, එම සේවකයන් දෙපාර්තමේන්තුවේ සේවයට එක්වීමට කැමැත්ත පළ කරන ලද අවස්ථාවේදී, එසේ සේවයට අනුයුක්ත කරනු ලබන නිලධාරීන් හා සේවකයන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව අදාළ අධිකාරිය තුළ ඒ තනතුරුවලට පත් කරන ලද දින සිට බලපැවැත්වෙන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම නිලධාරීන් හා සේවකයන් විසින් (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මේ කාරණා වාර්තාගත වීම් සඳහා අවශ්‍යයි. කරුණාකරලා නිශ්ශබ්දතාවය ආරක්ෂා කර දෙන්න. ඒ එක්කම ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා. ඒ ප්‍රකාශය සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කළා වාගේ මගේ කාලය ලබා දෙන්න කියලා මම ඉතා ගෞරවයෙන් ඉල්ලනවා. මේ සම්බන්ධයෙන් බොහෝ කරුණු කාරණා සාකච්ඡා කළා. ඇහුම්කන් දුන්නා. ඒ කරුණු කාරණාවල තියෙන්නේ බහුතරයක් රජයටත්, ඒ වාගේම මේ ව්‍යාපාරයටත් අහිතකර ඉතාම බොරු අවලාද ප්‍රකාශයන් තිබුණේ. ඒ නිසා මේ අහිතකර අවලාද ප්‍රකාශයන් සම්බන්ධව කරුණු පැහැදිළි කිරීමේ වගකීමක් අපට තියෙනවා. ඒ නිසා මේ පනත තුළ තියෙනවා රාජ්‍ය සේවකයෙක් විධියට සියලු සමෘද්ධි නිලධාරීන් සමෘද්ධි ව්‍යාපාරයේ ඉන්න අය, ඒ වාගේම දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ඉන්න අය, ඒ වාගේම උඩරට සංවර්ධන අධිකාරියේ ඉන්න අය මේ සියලුම දෙනා මේ පනත යටතේ මේ පනත පිහිටුවන දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාව යටතේ පත්වීම් ලබනවා. ඒ සියලුම දෙනාට පූර්ණ රජයේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ සියලුම දෙනා මෙතෙක් වැන්දඹු සහ අනත්දරු අරමුදල්වලට දායක වෙලා තිබුණේ නැහැ. වැන්දඹු අනත්දරු - ස්වාමියා හරි භාර්යාව හරි මිය ගියොත් ඒ වැන්දඹු අරමුදල යටතේ ඒ පහසුකම් ටික ලැබෙනවා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මේ සේවකයන් සඳහා මෙතෙක් තමන් විසින් දරන ලද අර්ථසාධක අරමුදල් තමන් අද සිට මේ දෙපාර්තමේන්තුවට පත් වෙනවා නම් තමන්ට හිමි

අර්ථසාධක අරමුදලත් ලැබෙනවයි කියන කාරණාව අපි වගකීමෙන් කියනවා. ඒ අලුත් පත්වීමක් විධියට ඕනෑම සේවකයෙකුට මේ තියෙන්නේ ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**

ගරු සභානායකතුමාට අවස්ථාව කාලය දීර්ඝ කිරීමට

## රීති අංක 30 යටතේ යෝජනාව

**ගරු සුනිල් ජයමිණි සභානායකතුමා**

ගරු සභාපතිතුමනි, මේ විවාදය අවසන් වන තුරු කාලය දික් කරන ලෙස මා යෝජනා කරනවා.

ඒ අනුව ......

**ගරු සභාපතිතුමා**

ඔබතුමාට තව විනාඩි දහයයි තියෙන්නේ.

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, මා ළඟ තියෙනවා 2011.08.24 වන දින කැබිනට් සංදේශයේ පිටපතක්. අපේ ගරු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මතු කරන්න හැදුවා, විශේෂයෙන්ම අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා සහ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා. මේ පනත හදිසියේ කලබලයෙන් ගෙන ආ පනතක් කියලා. මා ඉතාම පැහැදිළිව කියනවා, දෙපාර්තමේන්තුව පිහිටුවන්න මේ කැබිනට් තීන්දුව ගත්තේ ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ 24 වෙනිදා. එතකොට අවුරුද්දක් ප්‍රමාදයි මේ පනත එන්න. ඒ වාගේම මේ ඉල්ලීම සිද්ධ කළේ සමෘද්ධි නිලධාරීන් . සමෘද්ධ ව්‍යාපාරයට සම්බන්ධ ජනතාව මේ ඉල්ලීම් සිද්ධ කළේ, අවුරුදු පහළොවක් තිස්සේ තමන්ගේ රැකියාව සුරක්ෂිත කරන්න, අනාගත අභිවෘද්ධිය හදන්න. මේ ව්‍යාපාරය ඇතුලේ තිබුණ සාධනීය තත්ත්වයන් තව තවත් ශක්තිමත් කරන ගමන් අඩුපාඩු නිවැරදි කරලා මේ ව්‍යාපරය ඉදිරියට ගෙන යන්නයි. 1995 සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කරන කොට මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේකට සම්බන්ධ වුණා. ඒ වාගේම මේ ව්‍යාපාරය තුළට නිලධාරීන් විසිහතර දහසක් මුල් පියවරේදී සම්බන්ධ වුණා. ඒ වාගේම ඒ පියවර ගණනාවක් කරා අද වන කොට සෑහෙන පිරිසක් මේ ව්‍යාපාරය තුළ ප්‍රතිලාභ ලබන ගමන් අද රාජ්‍ය සේවයට සම්බන්ධ වෙලා තියෙනවා. මේ ව්‍යාපාරයට සම්බන්ධ ජනතාවට ඕනෑකමක් තිබුණා ගරු සභාපතිතුමනි, ඒ අයගේ පැත්තෙන්, සමෘද්ධි බැකු ව්‍යාපාරය ශක්තිමත් කරලා, ආර්ථිකය ශක්තිමත් කර ගෙන ජීවන තත්ත්වය උසස් කර ගන්න. ඒ වාගේම මේ ව්‍යාපාරයේ නිරත නිලධාරීන් විධියට මහ ලොකු අදෝනාවක්, ප්‍රශ්නයක් තිබුණා, තමන්ගේ රක්ෂාව සුරක්ෂිත නැහැයි කියලා. ඒකට එක් එක් හේතු තමයි, පසුගිය කාල පරි- ඡේදය තුළ සමාද්ධි නිලධාරීන් එක්සත් ජාතික පක්ෂ රජයක් යටතෙත් කටයුතු කළා ගරු සභාපතිතුමනි, මේ කාලය යටතේ, 2003.03.16 වනදා දිවයින පත්තරේ තවත් පවුල් ලක්ෂ පහක් සමෘද්ධි කැපීමට කටයුතු කරයි. ඒ කියන්නේ ඒ කාල පරි- ඡේදයේ ලක්ෂ පහක් සහනාධාර කැපුණා. ඒ වාගේම මම දිවයින 2003.07.17 වෙනිදා, යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිසංස්කරණ හරහා තව ලක්ෂ පහක් කපනවයි කියන

කාරණාව පැහැදිළි කරලා දුන්නා. ඒ වාගේම චක්‍රලේඛන යවලා මේ වැඩපිළිවෙළ ගම් මට්ටමින් සමෘද්ධි නිලධාරීන් ඉවත් කරලා ග්‍රාම නිලධාරීන් සහ තමන්ගේ පාක්ෂිකයන් එකතු කර ගෙන සහනාධාර කපා හැරීම් සිද්ධ වුණා.

ඒ වාගේම සමෘද්ධි අරමුදල් ගැන මෙතුමන්ලා කථා කළා. මේ අරමුදලේ එතුමන්ලාගේ රජය යටතේ ඒ කාලපරි- ඡේදය තුළ එක් කෝටි අනූ ලක්ෂයක් නිවාස අරමුදලේ මුදල් හොරකම් කළා. විනාශ කළා. ඒ වාගේම සමාජ ආරක්ෂණ අරමුදලේ මුදල් වෙනත් කටයුතු සඳහා යෙදවූවා ගරු සභාපතිතුමනි. මෙන්න මේ නිසා තමයි සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් ශක්තිමත් කරන්න ඕනෑ කියලා (බාධා කිරීම්) හරි එස් .බී. තමයි හිටියේ. ඒ ඕගොල්ලන්ගේ ආණ්ඩුව කාලයේ ඒ මුදල් කප්පාදු කළා ගරු සභාපතිතුමනි. ඒ වාගේම මේ කාලපරිච්ඡේදය තුළ සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් අහනවා. සමෘද්ධිය විනාශ කිරීමේ වැඩපිළිවෙළක් රජයට තියෙනවද කියලා. (පටිය අහන්න)

ඒ වාගේම සමෘද්ධි නිලධාරීන් දිගින් දිගටම - මේ තියෙන්නේ මා ළඟ 1998 ජූනි මාසෙ 10 වැනිදා දිවයින පත්තරේ. සමෘද්ධියේ තිස් හත්දාහක නිලධාරීන් වැඩියි කියලා අඩු කරන්න සැලසුමක් තිබුණා. නිලධාරීන් රක්ෂාව ස්ථිර කළේ නැහැ කියලා වහ බොන තත්ත්වයට ගියා ගරු සභාපතිතුමනි. මේ තත්ත්වය 2005 වර්ෂය වන කොට තව තවත් උත්සන්න වෙමින් ආපු නිසා සමෘද්ධි නිලධාරීන් මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා ළඟට වෘත්තීය සමිතියක් විධියට එක්ක ගෙන ගියා මම. ඒ අවස්ථාවේ ගරු ජනධිපතිතුමා කිව්වා මේ අයට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දෙන්න කටයුතු කරනවයි කියලා. ඒ අනුව ජනාධිපතිතුමා 2010 මහින්ද චින්තන ඉදිරි දැක්මට සමෘද්ධි නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම දෙනවයි කියන තීන්දුව ගත්තා ගරු සභාපතිතුමනි. ඒ තීන්දුව අරගෙන - මේ මා ළඟ තියෙනවා 2010 දෙසැම්බර් 14 ලක්බිම පුවත්පත. මේ සමෘදධි හා කෘෂි නිලධාරීන්ට විශ්‍රාම වැටුප් දෙනවා කියලා අතිගරු ජනාධිපතිතුමා සමස්ත ලංකා නිලධාරීන්ගේ සම්මේලනයටඇවිල්ලා කිව්වා. එතකොට මේක අද ඊයේ ආපු යෝජනාවක් නොවෙයි. යූ.එන්.පී. ආණ්ඩුව කාලෙත් මේ ඉල්ලීම් ඉල්ලුවා. ඒ වාගේම අනෙක් සියලු ආණ්ඩු කාලයේ චන්ද්‍රිකා කුමාරතංග ජනාධිපතිනියගෙ ආණ්ඩුව කාලයේ පවා මේ ඉල්ලීම් ඉල්ලලා ඒ ඉල්ලීම්වලට සාර්ථක ඉල්ලීම් නැති කාලේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මුණගැහිලා මේක සාර්ථක කරන්න කියලා ඉල්ලීමක් කළාට පස්සේ තමයි

**(සම්බන්ධය නිවැරදියි)**

**පූර්ණා**

**2012.09.25 - 04**

**(ගරු ජගත් කුමාර)**

අවස්ථාවේ මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිතුමා මුණ ගැහිලා මේක සාර්ථක කරන්න කියලා ඉල්ලීමක් කළාට පස්සේ තමයි මේ විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩ පිළිවෙළට ඉස්සෙල්ලාම ඒක පුද්ගල කොමිසමක් දැම්මේ. කොමිසමෙන් වැඩ පිළිවෙළක් හැදුවා. ඊට පස්සේ නියෝජ්‍ය ඇමැතිතුමා හරහා කමිටුවක් පත් කළා. කමිටුව හරහා යෝජනා දුන්නා. මේ හැම දෙයින්ම

විශ්‍රාම වැටුපක ඕනෑකම තිබුණා. ඒ වාගේම ව්‍යාපාරය ශක්තිමත් කරන්න, බැංකු ජාලය ශක්තිමත් කරන්න, දුප්පතුන් නඟා සිටුවන්න අද තිබෙන තත්ත්වයට වඩා වැඩියෙන් වැඩ පිළිවෙළක් ගෙන එන්න යෝජනා මේ තුළ දිගින් දිගටම ආවා. විශේෂයෙන් පත් කරපු කමිටු හරහා. ඒ තුළ ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාවගේ ඕනෑකම තිබුණු නිසා ජනාධිපතිතුමා මේක පිළිගත්තා. අපි මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාටත්, බැසිල් රාජපක්ෂ ගරු ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. වෙන කිසිවක් නිසා නොවෙයි. ලෝකයේ රාජ්‍ය සේවකයන්ගේ අයිතිවාසිකම් කප්පාදු වනකොට මේ රටෙත් බොහෝ රාජ්‍ය සේවකයන් පසුගිය අවුරුදු ගණනාවක රාජ්‍ය සේවයෙන් එළියට දානකොට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා 27,000 කට පූර්ණ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් ලබා දෙන්න මේ පනත හරහා ක්‍රියාත්මක වී තිබෙනවා. සමෘද්ධි බැංකු හරහා නීතියක් ක්‍රියාත්මක වුණේ නැහැ. අධිකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වුණේ නැහැ. සමෘද්ධි බැංකුවලට නෛතික පුද්ගලභාවය ලබා දීලා, සමෘද්ධි බැංකු ශක්තිමත් කරන්න ඒ හරහා සමෘද්ධි බැංකුවේ ඉදිරි කටයුතු සුරක්ෂිත කරන්න මේ පනත හරහා හැදෙනවා විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, අද සමෘද්ධි බැංකුම තමයි ඉදිරියේදී දිවි නැගුම බැංකු බවට පත් වෙන්නේ. දිවි නැගුම බැංකු හරහා මේ රටේ ජනතාවට සුවිශාල සේවාවක් කරන්න මේ පනත තුළ විශාල වගන්ති ප්‍රමාණයකින් කරුණු යෝජනා කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම අපේ සමහර මන්ත්‍රීවරු යෝජනා කළා, මේ පනතින් ඇමැතිවරයාගේ බලතල වැඩි වෙනවා. අරමුදල් රජයට ගන්නවා. ඒ වාගේම මේ පනතේ රහසිගත භාවය රකින්න කියලා රාජ්‍ය සේවකයන්ට කියලා තිබෙනවා. ඒ වාගේම මේ පනත තුළ අධ්‍යක්ෂවරු පත් කරන්නේ, ඇමැතිවරයා කියලා කිව්වා ගරු සභාපතිතුමනි. මම ළඟ තිබෙනවා සමෘද්ධි අධිකාරී පනත. මේ පනතේ නැති කාරණා මොනවාද කියලා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. සමෘද්ධි අධිකාරී පනතේ තිබෙන සියලුම කාරණා වාගේ දිවි නැගුම පනත් කෙටුම්පත තුළ තිබෙනවා. ඒ පනතේ තිබෙනවා. ගරු සභාපතිතුමනි, සමෘද්ධි අධිකාරී පනතෙත් තිබෙනවා – මේක බැංකු පනතට අදාළ නැහැ. මොකද, මේක ක්ෂුද්‍ර මූල්‍ය පාලන ව්‍යාපාරයක් විධියට යන්නේ. දිළින්දන්ගේ බැංකුව. මේ බැංකුව දුප්පත් ජනතාව ගොඩ නගන බැංකුවක් නිසා තවත් වාණිජ බැංකුවක්, තවත් ධනපතියන්ගේ බැංකුවක් බවට පත් වෙන්නෙ නැහැ. මේක සාමාන්‍ය ජනතාවගේ බැංකුවක් බවට පත් වෙන්න නම්, ඒ බැංකු පනතේ තිබෙන රෙගුලාසිවලින් නිදහස් වෙන්න ඕනෑ. ඒ වාගේම 100 ක්වත් එකතු කර ගන්න බැරි ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තිය සමිතියක් තමයි ගරු සභාපතිතුමනි, අධිකරණයට ගියේ. 100 ක් එකතු කර ගන්න බැහැ. මේ අයට බිම් මට්ටමේ හයිය තිබෙනවා කියලා තමයි නිතර කියන්නේ. බිම් මට්ටමේ හයිය තිබුණා නම්, එක සමෘද්ධි නිලධාරීන් 50 ක් 60 ක්වත් එළියට බස්සන්න තිබුණා. හැබැයි, මේ කාලපරිච්ඡේදය තුළ මේ පනතට විරුද්ධව එක නිලධාරියෙක් එළියට බස්ස ගන්න බැරි වුණා. ඒ වාගේම මේ පනතට පක්ෂව දහස් සංඛ්‍යාත ජනතාවක් එළියට බැහැලා (බාධා කිරීම්) මේ සඳහා සහයෝගය ලබා දුන්නා කියන කාරණය මම ප්‍රකාශ කරනවා ගරු සභාපතිතුමනි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ පනත සම්බන්ධව අධිකරණයට ගියා. වෙන යන්න තැනක් නැති නිසා අධිකරණයට ගියා. මේ ඇමැතිවරයාගේ බලතල ගැන

කිව්වා. අධිකරණය තුළ කිව්වා, ඇමැතිවරයා රජයට මුදල් ගන්න හදනවා. EPF එක ගන්න හදනවා. විවිධ දේවල් අධිකරණයට කිව්වා. හැබැයි ගරු මන්ත්‍රීවරුන්, උගත් මන්ත්‍රීවරුන් නම් තමුන්නාන්සේලා අවබෝධ කර ගන්න ඇයි අධිකරණය එහෙම නම් මුදල් බලතල සම්බන්ධව, ඇමැතිවරයාගේ බලතල සම්බන්ධව ප්‍රශ්න තිබෙනවා කියලා නොකිව්වේ. ඒ කිසි දෙයක් අධිකරණය පිළිගත්තේ නැහැ.

[සභාවේ ඝෝෂා]

අධිකරණය පිළිගත්තේ පළාත් සභා විෂයයට අදාළ කාරණා විතරයි. යම් ප්‍රමාණයකට මේ පළාත් සභාව එන්නේ. ඒ නිසා ඒ බලතල සම්බන්ධ කිසිදු ප්‍රශ්නයක්, තර්කයක් රජයට මේ පනත අක්‍රීය කරන්න ඕනෑය කියන තැනට අධිකරණය පිළිගත්තේ නැහැ ගරු සභාපතිතුමනි. (බාධා කිරීමක්) කෝ ඔබතුමාගේ සදාචාරය? සදාචාරය කෝ? ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත හරහා මේ රටේ සුවහසක් ජනතාව බලාපොරොත්තු වුණු බොහෝ දේවල් ඉෂ්ට සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මට කියන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත, දිගින් දිගටම ජනතාවගේ ඉල්ලීමක්. සමෘද්ධි නිලධාරීන්ගේ ඉල්ලීමක්. මේ පනත් කෙටුම්පත තුළ තිබෙන්නේ මේ රටේ ජනතා අපේක්ෂාව. ඒ නිසා පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලනවා කුහකකම්, පටු අරමුණු සහ දේශපාලන ඕනෑකම් නිසා මේ පනත කඩාකප්පල් කරන්න උත්සාහ කරන්න එපා. එකක් මේ පනත කඩාකප්පල් කරන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාවත්, බැසිල් රාජපක්ෂ ඇමැතිතුමාවත් ඉඩ දෙන්නේ නැහැ. ඒ වාගේම බස්නාහිර පළාත් සභාව වාගේම අනෙකුත් පළාත් සභාවලත් තමුන්නාන්සේලාගේ කුමන්ත්‍රණයට ඉඩ දෙන්නේ නැහැයි කියන කාරණාව තහවුරු වෙලා තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන් මතක් කරනවා රටේ ජනතාව ඉන්නේ රජයත් එක්ක.

**ගරු සභාපතිතුමා**

කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**

රජයත් එක්ක ඉන්න නිසා තමුන්නාන්සේලාගේ -

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මූලාසනයට ගරු කරන්න. කථාව අවසන් කරන්න.

**ගරු ජගත් කුමාර**

මේ කෙනෙහිලිකම් කිසි විටකත් තහවුරු කරන්න බැහැයි කියන කාරණාවත් මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. පනත් කෙටුම්පත සම්බන්ධ අවසාන වැඩ කටයුතු ටික තියෙන්නේ. කරණාකරලා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න. උදේ ඉඳලාම ප්‍රශ්න ඇති වෙන්න හේතුව මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා - ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ පිළිබඳව ඔබතුමා මොකක් හරි තීන්දුවක් ගන්න. උදේ ඉඳලාම ප්‍රශ්න ඇති වුණේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගේ යම් යම් ප්‍රකාශ නිසා. මූලාසනය හැල්ලු කරනවා. සභාව හැල්ලු කරනවා. සභාවේ ගරුත්වය නැති වෙනවා. සමහරු ලකුණු දාගන්න, රූපවාහිනියට පේන්න යම් යම් ප්‍රකාශ කරනවා.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ දිවි නැගුම පනත් කෙටුම්පත සාකච්ඡාව මෙම අවස්ථාවේදී අවසන් වෙනවා. සභාවේ එකඟතාවය අනුව අපට වගන්තියෙන් වගන්තිය සාක- ඡා කරන්නත් අවස්ථාව තිබෙනවා. ඒක සභාව තීරණය කරන ආකාරයට සභා සම්මත කිරීමට හැකියාවත තිබෙනවා.

**ගරු සුනිල් ජයමිණි**

එකවර ඡන්දය විමසීමක් කරන්න.

**ගරු සභාපතිතුමා**

ඒ අනුව දිවි නැගුම පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව අවසන් වෙනවා. එම පනත් කෙටුම්පතට සභාවේ බෙදීමක් පවතිනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල**

බෙදීමක් පවතිනවා.

**ගරු සභාපතිතුමා**

කරුණාකරලා සීනුව නාද කරන්න.

***ඊට අනුකූලව 63 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 64 යි විපක්ෂව 24 යි වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

**ගරු සභාපතිතුමා**

සභාවේ තීරණය වූ පරිදි පනත් කෙටුම්පත පිළිබඳ අදහස් අතිගරු ජනාධිපතිතුමා වෙත දැන්වීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන මෙන් මම මේ අවස්ථාවේදී ලේකම්තුමාට නියෝග කරනවා.

**කල් තැබීම**

**ගරු සභාපතිතුමා**

*''දැන් මම මෙම සභාව කල් තබනවා.''*

***ඊට අනුකූලව අ.භා. .......... ට 2012 ඔක්තෝබර් මස 09 වන දින පෙ.ව. 09.30 දක්වා කල් තබනවා.***